වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report 2022



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ நிலையம
Disaster Management Centre



වාර්ෂික වාර්තාව

2022

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117

පටුන

1	හැඳින්වීම			1
	1.1	ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව		1
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා		2
2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්			3
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ		3
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්		3
	2.3	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)		4
	2.4	විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)		5
	2.5	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය		6
		2.5.1	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්	7
	2.6	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල විස්තරය		8
		2.6.1	2022 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය	8
		2.6.2	2022 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලය	9
		2.6.3	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	9
	2.7	2022 වර්ෂයේ ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳ විග්‍රහය		10
		2.7.1	ආපදා බලපෑම් විශ්ලේෂණය	10
3	ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්			16
	3.1	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2022-2030 වර්ෂය සඳහා සැකසීම		16
	3.2	ආපදා මධ්‍යයේ විභාග සඳහා ප්‍රවේශය - 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2022		16
	3.3	ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය (IDDRR)		17
	3.4	ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය (WTAD)		17
4	2022 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය			18
	4.1	පෙර සූදානම් හා සැලසුම් අංශය		18
		4.1.1	දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම්	18
		4.1.2	ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම්	19
		4.1.3	මෝසම් පෙර සූදානම් වැඩසටහන - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය	19
		4.1.4	ආපදා අවස්ථාවලදී කාන්තාවන්ට හා ළමයින්ට ඇතිවිය හැකි හිංසනය හා කළමනාකරණය පිළිබඳ අත්පොත් නිර්මාණය කිරීම, සංවේදීකරණය සහ පුහුණුව	20
		4.1.5	ගංවතුර පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සහ ප්‍රාදේශීය සූදානම සැලසුම් කිරීම පිළිබඳ වැඩමුළුව - මල්වතු ඔය, යාන් ඔය සහ මී ඔය ගංහා ද්‍රෝණි	20
		4.1.6	සුනාමි අවදානමට පාත්‍රවන පාසල් සඳහා සුනාමි ආපදා පෙර සූදානම් සැලසුම්	21
		4.1.7	ශ්‍රී ලංකාවේ සුනාමි සඳහා පාසල් සූදානම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරුම් ජාතික උත්සවය	22
		4.1.8	ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම සකස් කිරීම උඟව පළාත් වැඩසටහන	22

	4.2	පුහුණු හා දැනුවත් කිරීමේ අංශය		23
		4.2.1	ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	23
		4.2.2	දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	27
		4.2.3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් - 2021 සහ 2022	32
	4.3	අවම කිරීම, පර්යේෂණ හා සංවර්ධන අංශය		33
		4.3.1	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	34
		4.3.2	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	35
		4.3.3	ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයතනික වගකීම් හා කාර්යභාරයන් සහ ජනතාවගේ අයිතීන් පිළිබඳ ලියවිල්ලක් සැකසීම	36
		4.3.4	ආපදා අවදානම් තක්සේරුව	37
		4.3.5	දුරස්ථ සංවේදය මත පදනම් වූ කැළෑ ගිනි හානි ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම	39
		4.3.6	දෛනික කැළෑ ගිනි පසුවිපරම් කිරීමේ Online GIS පද්ධතිය නිර්මාණය කිරීම	40
		4.3.7	ආපදාවන්ගේ අහිමි වීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම	41
		4.3.8	Desinventra දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම	41
		4.3.9	riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)	42
		4.3.10	මෝසම් සිතියම් නිර්මාණය	43
		4.3.11	චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම	43
		4.3.12	දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම	43
		4.3.13	වෙනත් ආයතන සමඟ සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	44
	4.4	භදිසි මෙහයුම් මධ්‍යස්ථානය		46
		4.4.1	ආපදා සාරාංශය	47
		4.4.2	භදිසි මෙහෙයුම් සැලැස්ම යාවත්කාලීන කිරීම (NEOP) (2017 – 2022)	48
		4.4.3	අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් යාත්‍රා (Boat) ස්ථානගත කිරීම	48
		4.4.4	පූර්ව දැනුම්දීම්	48
		4.4.5	ඇමතුම් මැදිරිය	50
		4.4.6	පුහුණු වීම්	51
		4.4.7	ප්‍රසම්පාදන	56
	4.5	තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය		57
	4.6	මූල්‍ය අංශය		61
		4.6.1	මූල්‍ය ප්‍රගතිය (2022 දෙසැම්බර් මස 31 දිනට)	61
	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය			**(ඇමුණුම 01)**
	2013 – 2022 දක්වා අවුරුදු 10ක මූල්‍ය තොරතුරු			**(ඇමුණුම 02)**
	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව			**(ඇමුණුම 03)**



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද 2022 වාර්ෂික වාර්තාව එළි දැක්වීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් සහ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස මා ඉතා සතුටට පත්වෙමි.

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ විෂයෙහි ප්‍රමුඛතම ආයතනය වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කැපී පෙනෙන ප්‍රගතියක් අත්කරගෙන සිටීමත් ආයතනය සතු විභවයන්, කුසලතාවයන් හා මූල්‍ය තිරසාරභාවයන් මෙම වාර්ෂික වාර්තාව හා එහි ඇතුළත් මූල්‍ය ප්‍රකාශනය මඟින් පිළිඹිබු වේ.

ආපදා කළමනාකරණය හුදෙක් එක් ආයතනයකට පමණක් ලඝුකළ යුතු දෙයක් නොවන අතර ප්‍රමුඛ ආයතනය වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අප අමාත්‍යාංශය යටතේ පවතින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මෙන්ම රටෙහි පවතින අනෙකුත් තාක්ෂණික ආයතන සමඟ මනා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම පැසසුම් කළ යුතුය. එමෙන්ම ආපදා කළමනාකරණය ලෝක සම්මුතීන්ට එකඟව, විශේෂයෙන්ම ආපදා අවදානම් කළමනාකරණය සඳහා වූ සෙන්දායි රාමුව, පැරිස් සම්මුතිය හා තිරසර සංවර්ධන ඉලක්කවලට අනුකූලව කටයුතු කිරීම තුළින් ඉලක්කගත වැඩපිළිවෙලක් කරා ගමන් කරමින් තිබෙන බව සඳහන් කළ යුතුය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2022 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් අතර ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම, ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ ජාතික ක්‍රමෝපාය සකස් කිරීම, ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ පළමු ප්‍රතිචාර දක්වන කණ්ඩායම් පුහුණු කිරීම මඟින් ධාරිතා වර්ධනයෙහි පැහැදිලි ප්‍රගතියක් අත්කරගෙන ඇත. එමඟින් ආපදා අවදානම් කළමනාකරණය කිරීම මෙන්ම ඇතිවිය හැකි ඕනෑම ආපදාවකට සාර්ථකව මුහුණදීම සඳහා ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය එක්ව සතියේ සෑම දිනකම පැය 24 පුරා සූදානම්ව තිබීම මඟින් විපතට පත්වන ජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම තහවුරු කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය රටේ පවතින මූල්‍ය අර්බුදය හමුවේ වුව ද ඉලක්කගත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාවයෙන් කටයුතු කළ අතර, විශේෂයෙන්ම ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) මෙන්ම අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන සඳහා අපගේ ස්තූතිය හිමිවිය යුතුය. එමෙන්ම ආපදා කළමනාකරණ විෂය ක්ෂේත්‍රය පුළුල් කරමින් දේශයේ සුරක්ෂිතතාවය සඳහා නවමානයක් සොයා ගැනීම සඳහා ජාත්‍යන්තරය වෙත යාමට නන් අයුරින් සහයෝගය ලබාදුන් දේශීය

විශ්ව විද්‍යාලයන් මෙන්ම එක්සත් ජනපදයේ සැල්ෆර්ඩ් හා හඩර්ෆීල්ඩ් විශ්ව විද්‍යාලවලට ද අපගේ කෘතඥතාවය හිමි වේ.

ආපදා අවදානම් කළමනාකරණය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරය මඟින් වාර්ෂිකව ප්‍රමුඛත්වයෙහිලා මුදල් වෙන් කරන අතර, විදේශීය ආධාර ලබාදෙන ආයතන මෙන්ම අනෙකුත් සහයෝගිතා ආයතන මඟින් ද ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් සඳහා යම් මූල්‍ය දායකත්වයක් ලබා දී ඇත. ගතවුණු 2022 වර්ෂය අභියෝග රාශියක් මධ්‍යයේ වූවද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් කරන ලද කාර්යයභාරය අගය කළ යුතුය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙම සාර්ථකත්වය සඳහා කැපවීමෙන් ක්‍රියාකළ අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාමික මේජර් ජෙනරල් සුදන්ත රණසිංහ මහතා ඇතුළු කාර්යය මණ්ඩලය වෙත මාගේ සුභාශිංසන පිරිනමන අතර, ඒ සඳහා උපදෙස් ලබාදීම හා මහපෙන්වීමට ලැබීම අමාත්‍යාංශ ලේකම් ලෙස මෙන්ම අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සභාපති වශයෙන් ලද භාග්‍යයක්කොට සලකමි.

අවසන් වශයෙන් දේශගුණික විපර්යාස හා ගෝලීය උණුසුම් වීම හේතුවෙන් ක්‍රමිකව වර්ධනය වන ආපදාවන්, විශේෂයෙන් ගංවතුර, නායයෑම්, නියඟය, සුලි කුණාටු තත්ත්වයන් සහ අනෙකුත් ආපදාවන්ගේ වර්ධනය නිසා ඇතිවන බලපෑම් කල් ඇතිව හඳුනාගැනීමත් ඒ සඳහා මුහුණදීමේ අභියෝගය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හමුවේ පවතින අතර, පෙර වසරවලදී ලැබූ අත්දැකීම් හා අත්කරගත් ධාරිතා වර්ධනයේ ප්‍රතිඵලයන් මත වඩාත් සුරක්ෂිත හෙට දිනක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීමට හැකිවනු ඇතැයි යන විශ්වාසය මා තුළ පවතින අතර, මාගේ අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන සහ අනෙකුත් තාක්ෂණික ආයතන මනා සහයෝගයෙන් කටයුතු කරමින් මෙම අභියෝගය ජයගනු ඇතැයි විශ්වාස කරමි.

මෙහිදී මෙම කාර්යයන් සාර්ථකව ඉටුකිරීම සඳහා නායකත්වය ලබාදුන් අතිගරු ජනාධිපතිතුමන්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් සහ ආපදා කළමනාකරණ ජාතික සභාවේ සියලුම සාමාජිකයන් හට මාගේ කෘතඥතාව පළකරන අතර, මාගේ අමාත්‍යාංශය යටතේ පවතින ආපදා කළමනාකරණ අංශයේ පවතින අනෙකුත් ආයතනවල ප්‍රධානීන්ට ද මාගේ ස්තූතිය පුද කරමි.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද 2022 වාර්ෂික වාර්තාව එළි දැක්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුභාශිංසන පණිවුඩය



ගෝලීය උණුසුම් වීම, කාලගුණික හා දේශගුණික විපර්යාස හමුවේ රටතුළ ක්‍රමිකව වැඩිවෙමින් පවතින ආපදාවන් 2022 වර්ෂයේ දී රටතුළ පැවැති කොවිඩ් 19 අවදානම් තත්ත්වය හමුවේ කළමනාකරණය කිරීමේ අභියෝගය ජයගැනීමේ වගකීම අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහය ඇතිව සාර්ථක කර ගැනීමට හැකිවීම මහත් භාග්‍යක් කොට සලකමි. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වූ ප්‍රධාන වගකීම දරන ආයතනය වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්ත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා විශේෂයෙන් ආපදා අවම කිරීම සඳහා පියවර ගැනීම, පෙර සූදානම් සැලසුම් සකස් කිරීම, පුහුණු හා දැනුවත් කිරීම මඟින් අවදානම අවම කරගැනීම හා පූර්ව අනතුරු ඇඟවීම හා හදිසි මෙහෙයුම් ක්‍රියාවලිය මඟින් ජනතාව බේරා ගැනීම සඳහා අප ආයතනය සතු ප්‍රධාන අංශයන් මඟින් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා මානව සම්පත් හා පරිපාලන අංශය, මූල්‍ය අංශය මෙන්ම අභ්‍යන්තර විගණන අංශය ද පවරන ලද කාර්යයන් මැනවින් ඉටු කිරීමට සමත්වීම 2022 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රාමාණික ප්‍රගතියක් අත්කර ගැනීමට සමත්වීම හා මෙම වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනය සම්පාදනය කර ඉදිරිපත් කිරීමට හැකිවීම පැසසුමට කරුණකි.

2022 වසර තුළදී මෝසම් වර්ෂා මඟින් ප්‍රේරණය කරන ලද ආපදාවන් ගංවතුර, නායයෑම්, කණ්ඩි කඩා වැටීම්, දැඩි සුළං, අකුණු අනතුරු මෙන්ම නියඟය, ගිනි ගැනීම් සහ දියේ ගිලීම් වැනි අනතුරුවලින් පුද්ගලයින් 91 දෙනෙකු මරණයට පත්වූ අතර තුවාල සිදුවීම් 79ක් වාර්තා විය. එමෙන්ම, එම ආපදාවලින් ආසන්න වශයෙන් පුද්ගලයින් 185,120ට වැඩි ප්‍රමාණයක් බලපෑමට ලක්වී ඇත. එසේම ඉහත ආපදා හේතුවෙන් නිවාස රැසකට හානි සිදුවී ඇත. කෙසේ වූව ද එම අනතුරු අවම කර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, විශේෂයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ එක්ව අවදානම් සමඟ ජීවත්වන ප්‍රජාව වෙත පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත්කර එම ප්‍රජාව ආරක්ෂිත ප්‍රදේශ කරා ඉවත් කිරීමට කටයුතු කර ඇත.

ආපදා අවදානම් කළමනාකරණය සඳහා ගෙන ඇති ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් අතර ආපදා කළමනාකරණ සැලැස්ම 2022 - 2030 සැකසීම, ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා ක්‍රමෝපායන් සැකසීම, ආයතනික ආපදා කළමනාකරණ සැලැසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම විශේෂ මානයන් ලෙස මෙහිදී සඳහන් කල යුතුය. එමෙන්ම, පාසල් දරුවන් ආපදා මධ්‍යයේ විභාග සඳහා ප්‍රවේශය හදිසි ආපදාවන් යටතේ වූව ද බාධාවකින් තොරව විභාගයට පෙනී සිටීම සඳහා මහඟු පිටුවහලක් විය.

2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය මඟින් ලබාදුන් රුපියල් මිලියන 7.5ක මුදල් යොදා ගනිමින් පෙර සූදානම් හා සැලසුම් අංශය මඟින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී මට්ටමින් ව්‍යසන කළමනාකරණ ශක්‍යතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලැසුම් සකස් කරන ලදි. එමෙන්ම සුනාමි, ජලගැලීම් හා නායයෑම් පෙරහුරු වැඩසටහන් පැවැත්වීම, උවදුරු සිතියම්ගත කිරීම හා අවදානම් තත්ත්ව විශ්ලේෂණය වැනි වැඩසටහන් පැවැත්වීම සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. මේ සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ස්වේච්ඡා සංවිධාන විසින් ලබාදුන් සහයෝගය විශේෂයෙන් අගය කළ යුතුය.

ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.75ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර එමඟින් දිස්ත්‍රික් ව්‍යාපෘති අවසන් කර එහි ප්‍රගතිය 85%ක් කරා ගෙන ඒමට සමත්ව ඇත. ආපදා කළමනාකරණ විෂය සාමූහික ක්‍රියාදාමයක් වියයුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යාවශ්‍ය කාරණයක් වේ. ස්වාභාවික හා මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුය.

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය පැය 24 x 7 පුරා ක්‍රියාත්මක කරන ලද අතර 2022 වර්ෂයේ දී ජල ගැලීම්, දැඩි සුළං, නායයෑම්වලින් විපතට පත් පවුල් සුරක්ෂිත කිරීම, පොලිසිය හා ත්‍රිවිධ හමුදා සහය ඇතව මුදවා ගැනීමේ හා සහනාධාර ලබාදීමේ මෙහෙයුම් කටයුතු සඳහා දායකත්වය ලබා දී ඇත. එමෙන්ම විපතට පත් ජනතාව බේරා ගැනීම සඳහා පුහුණු පාඨමාලා රාශියක් සිදුකිරීම මඟින් පළමු ප්‍රතිචාර දක්වන කණ්ඩායම්වල ධාරිතා වර්ධනය කිරීම මඟින් එම කණ්ඩායම් රටතුළ ඇතිවන ඕනෑම ව්‍යසනයකට මුහුණ දීම සඳහා සවිබල ගන්වා ඇත.

රටතුළ පැවති කොවිඩ් අවදානම් තත්ත්වය සහ ආර්ථික තත්ත්වය හමුවේ වුවද මෙවැනි සාර්ථකත්වයක් වෙත ළඟා වීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත මහපෙන්වන ලද ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මෙන්ම අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සභාපති විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න මැතිතුමා වෙත මාගේ කෘතවේදීත්වය පළ කරන අතර ආපදා කළමනාකරණය සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් ආපදා කළමනාකරණ අංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ජාතික සහන සේවා මධ්‍යස්ථානය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ ජාතික සැලැසුම් දෙපාර්තමේන්තුව වෙත ද මාගේ ස්තූතිය පුද කරමි.

සුදන්ත රණසිංහ ආර්ඩබ්පි ආර්එස්පි එම්එස්සි එන්ඩියු පිඑස්සි
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

1. හැඳින්වීම


ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මඟපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය, ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ සඳහා මඟපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව ව්‍යසන කළමනාරකරණය සඳහා වූ ජාතික සභාව 2005 වසරේ දී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය ගරු ජනාධිපතිතුමාගේ සභාපතීත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරු, පළාත් ප්‍රධාන අමාත්‍යවරු (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි (සටහන 1.1).



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- සමුද්‍රීය උපද්‍රවයන්
- ගිනි
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු
- වසංගත තත්ත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ, ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්ත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් ඇති කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් අංශ හතකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය සකස් වී ඇත.

ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත සඳහන් වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් හා පරිපාලන අංශය
6. මූල්‍ය අංශය
7. අභ්‍යන්තර විගණන අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රට තුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසාර සංවර්ධනයක්.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්ත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම්,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.

- පෙර සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම හා ප්‍රචාරණය.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම් ව්‍යුහාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අවම කිරීම සඳහා සංවර්ධන ප්‍රවාහයට ආපදා අවදානම් අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණය හා මූල්‍ය පාලනය අධීක්ෂණය හා මෙහෙයවීම සම්බන්ධව තීරණ ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ විෂයභාර කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර 2022 වර්ෂය තුළ දී රැස්වීම්වාර 4ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී යුඑස්පී එන්ඩීසී පීඑස්සී	-	සභාපති
ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයෙක් පී.ඩී.අයි.එල්. විජේගුණවර්ධන මහත්මිය, අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු)	-	සාමාජික
ආර්. එම්. ඩී. කේ. ජී. එන්. බී. රණතුංග මහතා , අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය	-	සාමාජික
කේ.ඒ.එස්.මහේෂී මහත්මිය, අතිරේක ලේකම් (සංවර්ධන) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය	-	සාමාජික
ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	-	සාමාජික
එච්.යු.ආර්.ෆොන්සේකා මහතා, ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	-	සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේජර් ජෙනරාල් එස්.රණසිංහ (විශ්‍රාමික) ආර්ඩබ්පී ආර්එස්පී එම්එස්සී එන්ඩීයු පීඑස්සී	-	ලේකම්

2.4 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත දැක්වේ.

අනු අංකය	නම, තනතුර හා ආයතනය	කමිටුවේ තනතුර
01	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී. රණතුංග මහතා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය	සභාපති
02	ආර්.එම්.පී.එස්. රත්නායක මහතා - අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති), ආරක්ෂක අමාත්‍යාංශය.	සාමාජික
03	එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා - ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අංශය	සාමාජික
04	එල්.බී.ජී. සඳමාලි මහත්මිය - විගණන අධිකාරි (වැ.බ.), ජාතික විගණන කාර්යාලය.	නිරීක්ෂක
05	ජේ.ඒ.ඩබ්.කේ. ජයකොඩි මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක,ආපදා කළමනාකරණ අංශය.	නිරීක්ෂක
06	මේජර් ජෙනරාල් එස්. රණසිංහ මහතා (විශ්‍රාමික) - අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක.	ලේකම්
07	ජේ.එච්.පී. ජයලත් මහතා - අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.	කැඳවුම්කරු

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව මෙහිදී සාකච්ඡාවට භාජනය කර ඇත. විශේෂයෙන්ම අභ්‍යන්තර විගණක විසින් 2022 වර්ෂය සඳහා සකස් කර තිබූ අවදානම් පදනම් කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය, පාලන ක්‍රියාවලිය හා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළව මතුකර තිබූ විගණන නිරීක්ෂණ මෙම කමිටුවේදී වැඩි දුරටත් විශ්ලේෂණය කරමින් ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ඉවහල් වන පරදි විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබා දී ඇත.


ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 134 දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල දැක්වෙන උපදෙස්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හා ජාතික විගණන පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේදී කරුණු සාකච්ඡා කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලා ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2022 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරීත්වය වෙත යොමු කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවට අදාළව ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාරයන්වල පූර්ව නිශ්චය කර ගත් අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිත කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම කළමනාකරණ අංශයක් ම සමාලෝචනය කිරීම සිදු කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසර ලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩ සටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිර්ණය කිරීම සිදු කිරීම පැවරී ඇති අතර එම කාර්යයන් ඉදිරි වර්ෂවලදී ද මනාව සිදු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සැලසුම් කර ඇත.

2.5 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

සටහන 2.1හි දක්වා ඇති පරිදි ආපදා කළමනාරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරනු ලබන විවිධ කාර්යයන් හා වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්

වගුව 2.1: මාණ්ඩලික නිලධාරීන්ගේ සුදුසුකම්

නම	තනතුර	අධ්‍යාපනික සුදුසුකම්
මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ ආර්ඩබ්පි ආර්එස්පි එම්එස්සි එන්ඩියු පිඑස්සි	අධ්‍යක්ෂ ජනරාල්	විද්‍යාපති (සංග්‍රාම අධ්‍යනය) (පකිස්ථානය) විද්‍යාවේදී (හමුදාමය හා දේශපාලන මූලෝපාය) (චීනය) විද්‍යාවේදී (සංග්‍රාම අධ්‍යනය) (පකිස්ථානය) ඩිප්ලෝමාව (පිරිස් කළමනාකරණය)
රොහාන් ප්‍රියන්ත සමරක්කොඩි	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	විද්‍යාපති (විශ්ලේශණ රසායන විද්‍යාව) විද්‍යාවේදී (විශේෂ) (රසායන විද්‍යාව) C.Chem. M.I.Chem. C
දිසානායක මුදියන්සේලාගේ සුගතදාස	අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්)	ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව) ශාස්ත්‍රපති (අපරාධ විද්‍යාව) පශ්චාත් ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කටයුතු) ශාස්ත්‍රවේදී (විශේෂ) (සමාජ විද්‍යාව සහ අපරාධ විද්‍යාව)
ජයවීර මුදියන්සේලාගේ සුනිල් ජයවීර	අධ්‍යක්ෂ (පෙර සූදානම්)	විද්‍යාපති (ග්‍රාමීය හා නගර සැලසුම්) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ව්‍යවහාරික සමාජ විද්‍යාව) විද්‍යාවේදී (විශේෂ) (දේපළ කළමනාකරණ හා තක්සේරු) වරලත් නගර නිර්මාණ ශිල්පී
අමරසිංහ ආරච්චිලාගේ අනෝජා කුමාරි සෙනෙවිරත්න	අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන)	විද්‍යාපති (භූ ගර්භ දත්ත විද්‍යාව හා භූ සමීක්ෂණ) (නෙදර්ලන්තය) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (මානව සම්පත් කළමනාකරණය) විද්‍යාවේදී (විශේෂ) (භූ ගර්භ විද්‍යා) ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සම්බන්ධතා) වරලත් ඉංජිනේරු ආයතනය (එ.රා.) (කොටස I සහ II)
කිරිපිටිය අබේසිංහගේ නිශාන්ත	අධ්‍යක්ෂ (මුදල්)	විද්‍යාපති (වෘත්තිය ගිණුම්කරණය) විද්‍යාවේදී (ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය)
වැලිහිඳ පතිරන්නැහැලාගේ අදීප කමල්ජිත් තිලකරත්න	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)	විද්‍යාපති (කළමනාකරණය) ශාස්ත්‍රවේදී ඩිප්ලෝමාව (කළමනාකරණය)
බ්‍රිගේඩියර් වැලිවේරිය ලියනගේ අනිල් ක්‍රිශාන්ත පෙරේරා ආර්ඩබ්පි ආර්එස්පි යුඑස්පි	අධ්‍යක්ෂ (මෙහෙයුම්)	විද්‍යාපති උපාධිය (ආරක්ෂක අධ්‍යනය) ඩිප්ලෝමාව (ආරක්ෂක කළමනාකරණය) ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සම්බන්ධතා) PQHRM (CIPM), NDHRTD (CIPM)

2.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල විස්තර

2.6.1 2022 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල සිවිල් කාර්යය මණ්ඩලය

වගුව **2.2:** 2022.12.31 දිනට කාර්යය මණ්ඩල විස්තරය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	6	6	0
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	10	05
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	22	03
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	0	1
පුද්ගලික සහකාර	1	0	1
විමර්ශන නිලධාරී	1	1	0
දුර දැනීම/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	0	1
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකලයාධිපති	1	0	1
සංවර්ධන නිලධාරී	101	0	101
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	4	2
චලන හා නිශ්චල කැමරා ශිල්පී	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පී	3	1	2
ගුවන් විදුලි ක්‍රියාකරු	1	1	0
කළමනාකරණ සහකාර / ආපදා කළමනාකරණ සහකාර	201	171	30
රියදුරු	39	36	3
කාර්යාල සහායක	35	30	5
එකතුව	**465**	**288**	**177**

2.6.2 2022 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් ඒකකවල ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලය

වගුව **2.3:** 2022 දෙසැම්බර් 31 දිනට ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය නියෝජනය කරන කාර්යය මණ්ඩලයේ විස්තර

ස්ථානය	ශ්‍රී ලංකා යුධ හමුදාව		ශ්‍රී ලංකා නාවික හමුදාව		ශ්‍රී ලංකා ගුවන් හමුදාව		ශ්‍රී ලංකා පොලිසිය		එකතුව	
	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්	නිලධාරීන්	වෙනත් නිලයන්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යාලය	01	10	02	08	01	07	01	11	05	36
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කොළඹ			01		01	16	-	-	02	16
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - පුත්තලම					01	07	-	-	01	07
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - හම්බන්තොට			01		01	13	-	-	02	13
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - කළුතර	01	19	01				-	-	02	19
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - ගාල්ල	02	25					-	-	02	25
දිස්ත්‍රික් ආ: ක: ස: ඒකකය - මාතර	02	29					-	-	02	29
එකතුව	**06**	**83**	**05**	**08**	**04**	**43**	**1**	**11**	**16**	**145**
මුළු එකතුව	**89**		**13**		**47**		**24**		**161**	


2.6.3 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් 25 තුළම පිහිටුවා ඇත. එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක, කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරුයෙකු මෙන්ම රියදුරුවරයෙකුගෙන් ද සමන්විත වේ.

දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු සහ කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) 107 දෙනෙකු දිස්ත්‍රික්ක 25හි සේවය සඳහා යොදවා ඇත.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ශ්‍රී ලංකා යුධ හමුදා සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන්ගේ පරිපාලනය යටතේ ද සෙසු දිස්ත්‍රික් ඒකක සිවිල් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ පරිපාලනය යටතේ ද ක්‍රියාත්මක වේ.

සියලුම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධව දිස්ත්‍රික් ලේකම්ගේ මෙහෙයුම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. රූප සටහන 2.2හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය


2.7 2022 වර්ෂයේ ඇති වූ ආපදා තත්ත්වයන් පිළිබඳ විග්‍රහය

2.7.1 ආපදා බලපෑම් විශ්ලේෂණය - (www.desinventar.lk)


<u>සමස්ත බලපෑම - 2022</u>

2022 වසරේදී නියඟය, ගංවතුර, නායයෑම්, කණ්ඩි කඩා වැටීම්, ගල් පෙරලීම්, දියේ ගිලීම්, දැඩි සුලං, ගිනි ගැනීම්, අකුණු අනතුරු යනාදියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 185,120 ක් පමණ වේ. ගංවතුර නිසා පමණක් බලපෑමට ලක්වූ පුද්ගලයන් ගණන 138,071 ක් පමණ වේ. එමෙන්ම නියඟය හේතුවෙන් පුද්ගලයන් 24,626 සහ දැඩිසුලං සහ සුළි සුළං තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන් 40,688ක් බලපෑමට ලක්ව ඇත. ඉහතින් සඳහන් කළ ආපදා තත්ත්වයන් හේතුවෙන් මරණයට පත් වූ සංඛ්‍යාව 91ක් වන අතර තුවාල සිදුවීම් 79ක් වාර්තා වී ඇත. තවද, 2021 වසරට සාපේක්ෂව මරණ සංඛ්‍යාව සාපේක්ෂව අඩු අගයක් වාර්තා වී ඇත.


(2022/2/07 වන දින Desinventar දත්ත පද්ධතියෙන් භාගත කර ගන්නා දත්තවලට අනුකූලව මෙම තොරතුරු වාර්තා කර ඇත. එසේම මෙම දත්ත පද්ධතිය සෑම විටම, වාර්තා ගත වන තොරතුරු අනුව යාවත්කාලීන විය හැකි බව සලකන්න.)



සටහන 2.3: එක් එක් ආපදාවලින් සිදුවූ මරණ




සටහන 2.4: මරණ සහ තුවාල සිදුවීම් (2018 – 2022)



සටහන 2.5: ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව


නිවාස හානි - 2022

පසු ගිය වසර පහ තුළ සිදුවූ පූර්ණ හා අර්ධ නිවාස හානි අවස්ථා පහත පරිදි සන්සන්දනය කළ හැක. ඒ අතරින් 2022 වසර සඳහා නිවාස 12,324ක් අර්ධ වශයෙන් හානි වී ඇති අතර නිවාස 174ක් පූර්ණ වශයෙන් හානි වී ඇත.



සටහන 2.6: 2018 සිට 2022 දක්වා පූර්ණ හා අර්ධ නිවාස හානි සිදු වී ඇති ආකාරය


2022 දෙසැම්බර් මාසයේ 7,8,9 යන දිනයන්හි ඇති වූ 'මැන්ඩුස්' සුළි සුළං තත්ත්වය හේතුවෙන් නිවාස හානි වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර එම හානි විශාල වශයෙන් වාර්තා වන්නේ බදුල්ල, මොණරාගල, රත්නපුර, මඩකලපුව යන දිස්ත්‍රික්කයන් වෙතිනි.




සටහන 2.7: 2022 වසර තුළ නිවාස හානි සිදු වී ඇති ආකාරය

<u>එක් එක් අපදාවලින් විනාශ වූ / හානියට පත් නිවාස- 2022</u>

2022 වසර තුළ ආපදාවන් අනුව සිදුවූ නිවාස හානි සලකා බැලීමේ දී තද සුළං හේතුවෙන් නිවාස 10,324ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 41ක් පූර්ණව හානි වී ඇත. එසේම හදිසි ගිනිගැනීම් හේතුවෙන් නිවාස 53ක් අර්ධව හානි වී ඇති අතර නිවාස 106ක් පූර්ණ වශයෙන් හානියට පත්ව ඇත. මෙහිදී 2022 වසරේ සැප්තැම්බර් 28 වන දින කජීමාවත්තේ සිදු වූ හදිසි ගින්න විශේෂයෙන් සඳහන් කළ හැක.




සටහන 2.8: ආපදා අනුව සිදු වූ ඇති පූර්ණ නිවාස හානි




සටහන 2.9: ආපදා අනුව සිදු වූ ඇති අර්ධ නිවාස හානි

2022 වර්ෂයේ ආපදා හේතුවෙන් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කයන්


ඉහත සඳහන් කළ ආපදා තත්ත්වයන් හේතුවෙන් වැඩිම නිවාස පූර්ණ හානි වාර්තා වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර වැඩිම නිවාස අර්ධ හානි වාර්තා වී ඇත්තේ බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හිය. ඒ පිළිබඳ සටහනක් පහත දැක්වේ.




සටහන 2.10: 2022 වර්ෂයේ සිදු වී ඇති නිවාස පූර්ණ හානි - දිස්ත්‍රික් අනුව




සටහන 2.11: 2022 වර්ෂයේ සිදු වී ඇති නිවාස අර්ධ හානි - දිස්ත්‍රික් අනුව




සටහන 2.12: 2022 වසර තුළ සිදු වූ මරණ



සටහන 2.13: 2022 වසර තුළ සිදු වූ බලපෑමට ලක්වූ පුද්ගලයින් ගණන



සටහන 2.14: 2022 වසර තුළ සිදු වූ අර්ධ නිවාස හානි



සටහන 2.15: 2022 වසර තුළ සිදු වූ පූර්ණ නිවස හානි


3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2022 – 2030 වර්ෂය සඳහා සැකසීම

සෙන්දායි රාමුවට අනුරූපව සියලුම අවශ්‍ය පාර්ශව ආයතනවල සහභාගීත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (NDMP) 2023 – 2030 පිළියෙළ කර ඇති අතර එය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත ය.

ජාතික ආපදා කළමනාකරණ සැලසුම 2023 – 2030 රටේ ප්‍රධාන රාජ්‍ය ආයතන / සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO's), රාජ්‍ය නොවන සංවිධාන සහ මානුෂීය ආයතන අතර ඒකාබද්ධ ප්‍රවේශයක් ද ඇති කිරීමේ අරමුණින් ඇති කරන ලද අතර අදාළ පාර්ශවකාර ආයතන සම්බන්ධ කරගනිමින් ඒ පිළිබඳ සමාලෝචන රැස්වීමක් 2022 නොවැම්බර් 04 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. සැලසුම් කෙටුම්පතෙහි අන්තර්ගතය සමාලෝචනය කිරීම සඳහා සහභාගීවන්නන් සක්‍රියව දායක වූ අතර SFDRR හි හඳුනාගෙන ඇති ප්‍රධාන ප්‍රමුඛතා ක්ෂේත්‍ර හතර යටතේ දළ ක්‍රියාකාරී සැලසුම් හා උපායමාර්ග අධ්‍යනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලදි. මෙහිදී කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉතා ඵලදායී වූ අතර කෙටුම්පත් සැලසුමේ අන්තර්ගතය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යෝජනා ලබා ගැනීම සහ අදාළ ආධාරක සංවිධාන / ආයතනවල දායකත්වයෙන් යෝජිත අනාගත ක්‍රියාකාරී සැලසුම් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට ඉවහල් විය.

3.2 ආපදා මධ්‍යයේ විභාග සඳහා ප්‍රවේශය - 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2022



රජයේ ප්‍රධාන අධ්‍යාපනික විභාග පැවැත්වීම වාර්ෂිකව සිදුකරන අතර විභාග දෙපාර්තමේන්තුව විසින් නිවේදනය කරන ලද පරිදි 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2022 දෙසැම්බර් 18 වැනි දින පැවැත්විණි.

විභාග අපේක්ෂක සිසුන්ගේ (එනම් විභාග අපේක්ෂකයින්) සහ නිලධාරීන්ගේ ආරක්ෂාව සහතික කරන අතරම, අනපේක්ෂිත ස්වාභාවික විපත් මධ්‍යයේ විභාග බාධාවකින් තොරව පැවැත්වීම සහතික කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) විභාග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ මෙම සැලසුම සකස් කරන ලදි.

කාලගුණික තත්ත්වයන්ගේ අනපේක්ෂිත බව සැලකිල්ලට ගනිමින්, ස්වභාවික විපත්වලදී අනුගමනය කළ යුතු තීරණාත්මක මාර්ගෝපදේශ පිළිපැදීම සහ කිසිදු බාධාවකින් තොරව ජාතික විභාග පැවැත්වීම සඳහා දිස්ත්‍රික්කවල අදාළ රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කර සම්බන්ධීකරණය කර මෙම ජාතික ක්‍රියාකාරකම් සහතික කරන ලෙස දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 25 හි සහකාර අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙන ලදී. මේ සඳහා මාධ්‍ය සාකච්ඡා මඟින් ද දැනුවත් කිරීම් සිදුකරන ලදි.



2022.05.19 දින ප්‍රවෘත්ති සාකච්ඡාව - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

3.3 ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර දිනය (IDDRR)

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඔක්තෝබර් 13 වන දින ආපදා අවම කිරීමේ ජාත්‍යන්තර දිනය සමරනු ලැබුවේ "පූර්ව අනතුරු ඇඟවීම කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම තුළින් කිසිවෙකුට ආපදාවන් නොවීමට කටයුතු කිරීම" මෙම වැඩසටහන 2022 ඔක්තෝබර් මස 13 වන දින "Cinnamon Grand" හෝටලයේ දී පැවැත්වූ අතර මීට එංගලන්තයේ Huddersfield විශ්ව විද්‍යාලය, ආසියානු පෙර සූදානම් මධ්‍යස්ථානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අනුග්‍රහය දක්වන ලදි.





3.4 ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය (WTAD)

ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරීම වෙනුවෙන් 2022 ඔක්තෝබර් මස 28 වන දින මඩකලපුව කාත්තන්කුඩිය මධ්‍ය මහා විද්‍යාල පරිශ්‍රයේ දී පාසල් සිසු සිසුන් 600 සහ පාර්ශවකාර ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩසටහනක් පවත්වන ලදි.

2015 දී එක්සත් ජතීන්ගේ (UN) මහා සභාව විසින් රටවල්, ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සංවිධාන කැඳවමින් අවදානම අවම කිරීම සඳහා නව ප්‍රවේශයක් අනුගමනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා අදහස් බෙදා ගැනීම සඳහා ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය (WTAD) සම්මත කරන ලදි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නොවැම්බර් මස 5 ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය ලෙස නම්කළ අතර රටවල්, ජාත්‍යන්තර ආයතන සහ සිවිල් සමාජය අවදානම් අවම කිරීම පිළිබඳ නව ප්‍රවේශයක් හුවමාරු කර ගැනීමත් සුනාමි පිළිබඳ දැනුවත් කිරීම පුළුල් කිරීමටත් දැනුම් දෙන ලදි.

4. 2022 වර්ෂයේදී තාක්ෂණික අංශවල ප්‍රගතිය

4.1 පෙර සූදානම් හා සැලසුම් අංශය

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙරසූදානම් හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන එක් කාර්යයක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛනයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවාද යන්න සැලැස්ම තුළ ලේඛනගත කර ඇත.

පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

4.1.1 දිස්ත්‍රික් මට්ටමේ පෙර සුදානම් සැලසුම්

2022 වර්ෂයට ලැබුණු රු.මි.7.50 යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලදි. රටෙහි ආර්ථික තත්ත්වය ප්‍රවාහන අපහසුතා සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ.

වගුව 4.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2020 - 2022

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)
2020	5.50	4.54
2021	7.50	6.25
2022	7.50	2.43

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍රියතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2022 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත.

4.1.2 ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම්

2022 වර්ෂයේ දී ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් දිස්ත්‍රික් 23ක වැඩසටහන් 51ක් පවත්වන ලදි. මේ සඳහා රුපියල් 533,190.00ක් වියදම් දරන ලදි.




ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ වැඩසටහන් පැවැත්වීම - මහනුවර දිස්ත්‍රික්කය

4.1.3 මෝසම් පෙර සූදානම් වැඩසටහන - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය

නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම බලපාන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ කළ පෙර සූදානම් ක්‍රියාකාරකම් ලෙස පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදය, හදිසි ස්ථානගත කිරීම්, කණ්ඩායම් ස්ථානගත කිරීම හා සහන සේවා කටයුතු හා කඳවුරු කළමනාකරණය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. ඒ මඟින් සිදුවිය හැකි ජීවිත හා දේපළ හානිය අවම කර ගැනීමට බලාපොරොත්තු වේ.

ජාතික මට්ටමෙන් කාලගුණික ආයතන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අධික වර්ෂාව හා සුළි සුළං පිළිබඳව ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් පිළිබඳව ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජල ගැලීම් පිළිබඳව ද අනාවැකි හා පුරෝකථනයන් පාදක කර ගනිමින් ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන සහ ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් ලෙස ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා රාජ්‍ය නිලධාරීන් හා ආපදා සඳහා ගොදුරුවන ජනතාව ඊට මුහුණ දී ජීවිත හා දේපළවලට සිදුවන හානිය අවම කර ගැනීමට මේ තුළින් බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මඟින් දිවයිනට වාර්ෂිකව බලපාන නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් කාලවකවානුවලදී දිවයිනට බලපාන අධික වර්ෂාපතනයත්, දැඩි සුළං තත්ත්වයන් පදනම් කරගෙන එයට ගොදුරු වන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවා බලපෑ හැකි තත්ත්වයන් (ගංවතුර, නායයෑම්, සුළි සුළං) සඳහා අදාළ දිස්ත්‍රික්ක සූදානම් කිරීම අරමුණු වේ.

පූර්ව මෝසම් සැලසුම්වලට අනුකූලව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වසරේ අවසන් කාර්තුවේදී අපේක්ෂා කරන ඊසාන දිග මෝසම් සමය සම්බන්ධයෙන් මූලික සූදානම් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. වත්මන් අභියෝගාත්මක කාලය සලකා බැලීම, පෙර සූදානම හඳුනා ගැනීම සහ ක්‍රියාකාරකම්/ වැඩසටහන් සැලසුම් කිරීම සහ හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සපුරාලීම මෙමඟින් අපේක්ෂා කළ කාර්යයන් විය. මෙම රැස්වීම සඳහා ප්‍රධාන තාක්ෂණික ආයතනවල නියෝජිතයින්, අදාළ ආයතනවල රාජ්‍ය නිලධාරීන්, එක්සත් ජාතීන්ගේ මානුෂීය ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන

සංවිධාන ආදී විශාල පිරිසක් සහභාගී වූ අතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 25හි සහකාර අධ්‍යක්ෂවරු (DDMCUs) සහ පළාත් මට්ටමේ ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් Zoom තාක්ෂණය හරහා මාර්ගගතව රැස්වීමට සම්බන්ධ විය.

මීට අමතරව දිස්ත්‍රික් මෝසම් පෙර සූදානම් වැඩසටහන් දිස්ත්‍රික් 15ක සහ ප්‍රාදේශීය මෝසම් පෙර සූදානම් වැඩසටහන් 54ක් පවත්වන ලදි. මේ සඳහා රුපියල් 1,302,437/-ක මුදලක් වියදම් කරන ලදි.





4.1.4 ආපදා අවස්ථාවලදී කාන්තාවන්ට හා ළමයින්ට ඇතිවිය හැකි හිංසනය හා කළමනාකරණය පිළිබඳ අත්පොත් නිර්මාණය කිරීම, සංවේදීකරණය සහ පුහුණුව

ආපදා අවස්ථාවලදී කාන්තාවන්ට හා ළමයින්ට ඇතිවිය හැකි හිංසනය හා කළමනාකරණය පිළිබඳ අත්පොත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය හා UNFPA ආයතනයේ මූල්‍ය දායකත්වය මඟින් සකස් කරන ලද අතර එය 2022.08.19 දින එළි දක්වන ලදි. මෙම සංවේදීකරණය සහ පුහුණු වැඩසටහන් කළුතර, ගාල්ල, රත්නපුර, කෑගල්ල හා බදුල්ල යන දිස්ත්‍රික්කවල පවත්වන ලද අතර මෙම වැඩසටහන් සඳහා නිලධාරීන් 612ක් සහභාගී විය.



බදුල්ල දිස්ත්‍රික්කය



ගාල්ල දිස්ත්‍රික්කය

4.1.5 "ගංවතුර පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සහ ප්‍රාදේශීය සූදානම සැලසුම් කිරීම පිළිබඳ වැඩමුළුව - මල්වතු ඔය, යාන් ඔය සහ මී ඔය ගංගා ද්‍රෝණි"

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) තාක්ෂණික දායකත්වය ඇතිව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) හඳුනාගත් ගංඟා ද්‍රෝණි තුනක් (3) යටතේ ක්‍රියාත්මක වේ.

වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ දේශගුණික අවදානම් සහ ආන්තික අවස්ථාවන්ට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යටතේ ‘‘ගංවතුර පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සහ මල්වතු ඔය, යාන්ඔය සහ මීඔය ගංඟා ද්‍රෝණිවල ප්‍රාදේශීය සුදානම සැලසුම්’’ පිළිබඳ වැඩමුළුවක් 2022 දෙසැම්බර් 23 වන දින අනුරාධපුර හෙරිටේජ් හෝටලයේදී පවත්වන ලදී.

ඉහත සඳහන් වැඩමුළුව ගංවතුර පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම සහ අනුරාධපුර, මන්නාරම, කුරුණෑගල, පුත්තලම, ත්‍රිකුණාමලය සහ වවුනියාව දිස්ත්‍රික්කවල අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආපදා පෙර සූදානම් පිළිබඳ සමාලෝචනය කිරීම අරමුණු කර ගෙන ඇත.




4.1.6 සුනාමි ආවදානමට පාත්‍රවන පාසල් සඳහා සුනාමි ආපදා පෙර සූදානම් සැලසුම්

එක්සත් ජාතීන්ගේ සංවිධාන අනුග්‍රහය ඇතිව සුනාමි අවදානමට පාත්‍රවන දකුණු හා නැගෙනහිර පළාත්වල තෝරාගත් පාසල් 28ක් සඳහා සුනාමි ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත. පාසල් ආපදා සැලසුම් සකස් කිරීම පිළිබඳ දින 3ක වැඩසටහන් පවත්වන ලද අතර ඒ සඳහා ආපදා කළමනාකරණ සම්බන්ධ ගුරුවරුන්, විදුහල්පතිවරුන් කලාප සහ පළාත් අධ්‍යක්ෂවරුන් සහභාගී විය. මෙහි පළමු ව්‍යාපෘතිය පුහුණුවන්නන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහනක් ලෙස 2020 සැප්තැම්බර් මාසයේදී දකුණු පළාතේ තෝරාගත් පාසල් 11ක් සඳහා පවත්වන ලද අතර නැගෙනහිර පළාතේ මෙම ව්‍යාපෘතිය තෝරාගත් පාසල් 17ක පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නම්කරන ලද නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022 ඔක්තෝබර් 25 සිට 27 දින දක්වා පැවැත්විණි.


මෙම වැඩසටහනේ ඊළඟ පියවර වශයෙන් පුහුණු සැසියේදී සකස් කරන ලද ක්‍රියාකාරී සැලැසුම් අනුගමනය කිරීම සහ සැලසුම්කල පරිදි සුනාමි පෙරහුරු අභ්‍යන්තර ක්‍රියාත්මක කිරීම සහතික කිරීමත් පාසල් විසින් කළ යුතු වේ.




4.1.7 ශ්‍රී ලංකාවේ සුනාමි සඳහා පාසල් සූදානම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සැමරුම් ජාතික උත්සවය

ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සෑම වසරකම නොවැම්බර් මස 05 වන දිනට යෙදී ඇති අතර එය සැමරීම වෙනුවෙන් 2022 ඔක්තෝබර් මස 28 වන දින මඩකලපුව කාත්තන්කුඩිය මධ්‍ය මහා විද්‍යාල පරිශ්‍රයේ දී පාසල් සිසු සිසුන් 600 සහ පාර්ශවකාර ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩසටහනක් පවත්වන ලදි.

2015 දී එක්සත් ජාතීන්ගේ (UN) මහා සභාව විසින් රටවල්, ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සංවිධාන කැඳවමින් අවදානම අවම කිරීම සඳහා නව ප්‍රවේශයක් අනුගමනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා අදහස් බෙදා ගැනීම සඳහා ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය සම්මත කරන ලදි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නොවැම්බර් මස 5 ලෝක සුනාමි දැනුවත් කිරීමේ දිනය ලෙස නම්කල අතර රටවල්, ජාත්‍යන්තර ආයතන සහ සිවිල් සමාජය අවදානම් අවම කිරීම පිළිබඳ නව ප්‍රවේශයක් හුවමාරු කර ගැනීමත් සුනාමි පිළිබඳ දැනවත් කිරීම පුළුල් කිරීමටත් දැනුම් දෙන ලදි.





4.1.8 ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම සකස් කිරීම ඌව පළාත් වැඩසටහන

ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ වැඩසටහන ඌව පළාත කේන්ද්‍ර කර ගනිමින් 2022 සැප්තැම්බර් මස ආරම්භ කළ අතර මේ වන විට බදුල්ල මහ නගර සභාව සහ මොනරාගල ප්‍රාදේශීය සභාව සඳහා එම සැලසුම් කෙටුම්පත් කර ඇත. මීට අමතරව එම වැඩසටහන සඳහා මූලික දැනුවත් කිරීමේ කටයුතු උතුරු පළාත සඳහා ද ආරම්භ කර ඇති අතර නැඟෙනහිර පළාතේ ද එම කටයුතු ආරම්භ කිරීමට නියමිතය. මෙම වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සපයා ඇති අතර එම මුදල වන රු.මිලියන 40කින් මේ වන විට රු.මිලියන 4.6ක මුදලක් ඌව සහ උතුරු පළාත් වැඩසටහන් සඳහා වැය වී ඇත.






4.2 පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති වගකීම් අනුව ව්‍යසනවලින් මහජනතාව ආරක්ෂා කිරීමට මහජනතාව තුළ අවබෝධය හා දැනුම වැඩි කිරීමට මෙන්ම ව්‍යසන කළමනාකරණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම, ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට දායකවන සියලු පාර්ශවකාර ආයතන හා සංවිධාන සම්බන්ධීකරණය කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීම් අංශය විසින් අදාළ පාර්ශව හා කණ්ඩායම් පුහුණු කිරීම හා දැනුවත් කිරීම සිදුකරනු ලැබේ. ජාතික මට්ටමේ සිට දිස්ත්‍රික් මට්ටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා දිවයිනේ සියළු දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා පවතින ආපදා අවදානම් තත්ත්වයන් අවබෝධ කර ගෙන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2022 වර්ෂයේදි ද සිදුකරන ලදි.

2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිපාදන කාර්තු වශයෙන් ලබා දුන් අතර 2022.04.26 දින භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 3-2022 චක්‍රලේඛය අනුව සැලසුම් කරන ලද ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් අවලංගු කිරීම සහ ප්‍රමුඛතාව අනුව සීමා කිරීම සිදු වූ අතර ඒ අනුව භාණ්ඩගාර මූල්‍ය ප්‍රතිපාදන රු.මි.5.15 සහ රාජ්‍ය නොවන සංවිධාන මඟින් ලබා දුන් රු.මි.7.3ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන දැනුවත් කිරීම් අංශයේ වැඩසටහන් සිදු කරන ලදි.



සටහන 4.2.1: 2022 වර්ෂයේ දැනුවත් කිරීමේ අංශයේ මූල්‍ය ප්‍රතිපාදන භාවිතය

4.2.1 ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>විශ්ව විද්‍යාල, පාසල්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ඇතුළු පාර්ශවකාර ආයතනයන් හී නිලධාරීන් සහ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්</u>

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ කටයුතු කරන ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් ඇතුළු පාර්ශවකාර ආයතන නිලධාරීන් සහ පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ අංශය මඟින් 2022 වර්ෂයේ පහත සඳහන් පරිදි වැඩසටහන් සිදු කරන ලදි.

වගුව 4.2.1: විශ්ව විද්‍යාල, පාසල්, ත්‍රිවිද හමුදාව හා පොලිසිය ඇතුළු පාර්ශවකාර ආයතනයන්හි නිලධාරීන් සහ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	ඉලක්කගත කණ්ඩායම / දැනුවත් කිරීමේ වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ යුධ හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	04	540
02	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ගුවන් හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	02	76
03	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ නාවික හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	02	83
04	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨ සිසුන් හා පශ්චාත් උපාධි වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	03	36
05	ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ එක්සත් රාජධානියේ ලින්කොන් (Lincoln-UK) විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන	01	20
	එකතුව	**12**	**755**




ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ එක්සත් රාජධානියේ ලින්කොන් (Lincoln) විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන සහ කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන




ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සහ මුලතිව් ගුවන් හමුදා පුහුණු මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා පැවති හදිසි ප්‍රතිචාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

<u>පාසල් අධ්‍යාපනයේ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළට ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අනුගත කිරීමේ ජාතික වැඩසටහන</u>

අධ්‍යාපන අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික බාලදක්ෂ සංගමය, ජාතික බාලදක්ෂිකා සංගමය සහ ජාතික ශිෂ්‍යභට බලකාය යන ආයතන එක්ව බාලදක්ෂයින්, බාලදක්ෂිකාවන්, ශිෂ්‍යභටයන් ලෙස ක්‍රියා කරන පාසල් සිසුන් හට ලබා දෙන පුහුණු වැඩසටහන් සඳහා ආපදා කළමනාකරණ විෂය අන්තර්ගත කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් බාලදක්ෂ ව්‍යාපාරයේ ක්‍රියාකාරීව කටයුතු කරන නිලධාරීන් හට ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දී ඔවුන් පුහුණුවන්නන් පුහුණු කිරීමේ කණ්ඩායම් (Trainers of Training) ලෙස හඳුනා ගැනීම අරමුණු කර ගෙන මෙම වැඩසටහන ආරම්භ කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයේදී වයඹ සහ මධ්‍යම පළාත්වල අදාළ පාර්ශවකාර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වන ලදි.

<u>හදිසි ආපදා අවස්ථාවලදී ආබාධිත පුද්ගලයන්ගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම සම්බන්ධ ජාතික වැඩසටහන</u>

ආපදාවලදී ඉහළ ආපදා පාත්‍රතාවයක් (Vulnerability) සහිත ප්‍රජා කොට්ඨාසයක් ලෙස ආබාධිත සහිත පුද්ගලයින් (People with Disability) හඳුනා ගෙන ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විවිධ තාක්ෂණික ආයතනවලින් ලබා දෙන පූර්ව අනතුරු ඇඟවීම් නිවේදන ආබාධිත සහිත ප්‍රජාව වෙත ලබා දීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ආපදා අවස්ථාවලදී ඉවත් කිරීම් (Evacuation) සුරක්ෂිත ස්ථාන වෙත යොමු කිරීම් ආදී කටයුතුවලදී සුදුසු ප්‍රමිතීන් හඳුනාගැනීම සඳහා ආබාධිත සහිත ප්‍රජාව වෙනුවෙන් ස්ථාපිත වී ඇති ස්වේච්ඡා සංවිධාන ප්‍රධානීන්ගේ සහ ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායක වන ප්‍රමුඛතම පාර්ශවකාර ආයතන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් වැඩසටහන් දැනුවත් කිරීම් අංශය විසින් සංවිධානය කර වැඩසටහනක් 02ක් 2022 වර්ෂයේදී සිදු කරන ලදි.


<u>මාධ්‍ය සාකච්ඡා සහ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්</u>

හදිසි ආපදා අවස්ථාවන්වලදී සහ ආපදා තත්ත්වයන් පිළිබඳ පූර්ව අනතුරු ලබාදීමේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් විවිධ තාක්ෂණික ආයතනවල නියෝජනය ද සහිතව මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සිදු කරනු ලබයි. දැනුවත් කිරීමේ අංශය මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලුම මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබන අතර 2022 වර්ෂයේදී හදිසි ආපදා තත්ත්වයන් පිළිබඳ සියලුම මාධ්‍ය සාකච්ඡා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව පවත්වන ලදි.

<u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල හරහා මහජනතාවට තොරතුරු දැනුවත් කිරීම</u>

ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සහ මහජනතාව දැනුවත් කිරීම් සම්බන්ධ පූර්ව නිවේදන සහ තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවි හරහා සිදු කෙරේ. ඊට අමතරව ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ජාල යාවත්කාලීන කිරීම දැනුවත් කිරීමේ අංශය යටතේ පවතින මාධ්‍ය ඒකකය විසින් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම හදිසි ආපදා තත්ත්වයක දී දත්ත සහ තොරතුරු ක්ෂණිකව මාධ්‍ය වෙත

ලබාදීම, ජාතික සහ ජාත්‍යන්තර ආයතන දැනුවත් කිරීම සඳහා අවශ්‍ය දත්ත යාවත්කාලීන කිරීම දෛනිකව සිදු කරනු ලබයි.



ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන වෙබ් අඩවිය

<u>ජාතික සුරක්ෂිත දින වැඩසටහන</u>

2004 දෙසැම්බර් මස 26 දින ශ්‍රී ලංකාවට බලපෑ සුනාමි ව්‍යසන තත්ත්වය හේතුවෙන් ප්‍රකාශිත ජාතික සුරක්ෂිත දින සැමරුම වාර්ෂිකව දෙසැම්බර් 26 වන දින ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විවිධ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් එම ව්‍යසනයෙන් මියගිය ජනතාව ද සිහිපත් කරමින් සිදු කරයි.

ඒ අනුව 2022 වර්ෂයේ පැවති අභියෝග හමුවේ වුව ද දෙසැම්බර් මස 26 වන දින ජාතික සුරක්ෂිත දින සැමරුම ගාල්ල පැරැලිය සුනාමි ස්මාරකය අසලදි මිය ගිය ජනතාව සිහිපත් කරමින් පැවති අතර ජාතික සුරක්ෂිත දින වැඩසටහනට සමගාමීව සිංගප්පූරුව බෞද්ධ සංවිධානයක මූල්‍ය දායකත්වයෙන් ගාල්ල, මාතර, හම්බන්තොට, වව්නියාව, කෑගල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හී ආර්ථික අපහසුතා ඇති දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් සිදු කරන ලදි.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 25 කේන්ද්‍රකර ගෙන රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාවගේ ද සහභාගිත්වයෙන් සුනාමි ඇතුළු අනෙකුත් ආපදා සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මියගිය ප්‍රජාව සිහිපත් කිරීමේ සර්ව ආගමික වැඩසටහන් මාලාවක් එදින සිදු කරන ලදි.



ජාතික සුරක්ෂිත දින ප්‍රධාන වැඩසටහන- ගාල්ල, පැරැලිය සුනාමි ස්මාරකය අසල




ජාතික සුරක්ෂිත දිනයට සමගාමීව පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන- ගාල්ල, පැරැලිය සුනාමි ස්මාරකය

4.2.2 දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

<u>දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක මඟින් සිදු කරනු ලබන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන</u>

රටේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඒ ඒ දිස්ත්‍රික්කවල පවතින ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දිස්ත්‍රික් කාර්යාල වෙත පවරා ඇත. ඒ අනුව ආපදා අවදානම් සහිත ප්‍රදේශ හඳුනාගෙන ප්‍රජාව හා පාර්ශවකාර ආයතන සම්බන්ධීකරණය කරමින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 124ක් පවත්වා ඇති අතර ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය ප්‍රතිපාදන භාවිත කරමින් දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන සැලසුම් ක්‍රියාකාරකම්වල නිරත වන සැලසුම් නිලධාරීන් (Planning Officers), ඉංජිනේරුවන් (Engineers) සහ පළාත් පාලන ආයතනවල සේවයේ නියතු තාක්ෂණික නිලධාරීන් (Technical Officers) සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් 06ක් පවත්වන ලදි. ඒ අනුව මෙම වැඩසටහන් සඳහා විවිධ ඉලක්කගත කණ්ඩායම්වල පුද්ගලයින් 6950ක් සම්බන්ධ වී ඇත. ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.



සටහන 4.2.2: දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන



රාජ්‍ය නිලධාරීන් සඳහා ගිනි ආරක්ෂණ වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කය



ප්‍රථමාධාර හා කඳවුරු කළමනාකරණ පුහුණු වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය



තරුණ ස්වේච්ඡා කණ්ඩායම් සඳහා ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය



බෝට්ටු ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණු වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කය



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ සෞඛ්‍ය අංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කය



ආපදා කළමනාකරණය පිළිබඳ ආරක්ෂක අංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- කළුතර දිස්ත්‍රික්කය



නාය යාම් පිළිබඳ ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන- නුවර දිස්ත්‍රික්කය



ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පලාත් පාලන ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- කිළිනොච්චි දිස්ත්‍රික්කය

<u>දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශන හරහා පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන</u>

දැනුවත් කිරීම් අංශය මඟින් සකස්කර ඇති ප්‍රදර්ශන කට්ටල උපයෝගී කර ගෙන පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රදර්ශන වැඩසටහන් සිදු කරනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂයේදී ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශන 04ක් පවත්වා ඇත.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ලෝක ළමා දිනයට සමගාමීව පවත්වන ලද ‘‘ලෝක ළමා දින රුවන්වැල්ල සැමරුම’’, සබරගමුව විශ්ව විද්‍යාලය මඟින් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ‘‘GEOWEEK’’ අධ්‍යාපනික ප්‍රදර්ශනය සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුරියවැව වමල් රාජපක්ෂ විද්‍යාලය හා තිස්සමහාරාම යඨාල තිස්ස ප්‍රාථමික විදුහලේ පැවති ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන කුටි පැවැත්වීමටත් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමටත් කටයුතු කරන ලද අතර මෙම කුටි නැරඹීමට මහජනතාව, පාසල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන් 10,000කට ආසන්න පිරිසක් සහභාගී වී ඇත.

<u>ආපදා අවදානම් සහිත ප්‍රදේශවල ප්‍රජාව දැනුවත් කිරීමේ පුවරු සවි කිරීමේ වැඩසටහන</u>

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දීර්ඝ කාලයක සිට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා විවිධ ආපදා සම්බන්ධව ආපදා අවදානම් ප්‍රදේශවල ප්‍රජාව දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම සිදු කරමින් තිබේ. සුනාමි, නායයෑම්, කැලෑ ගිනි, දියේ ගිලීම්, ගංගා ජලාශ සහ සාගරය ආශ්‍රිත ගංවතුර, කිඹුලන්ගෙන් ඇතිවන අනතුරු ආදී වූ විවිධ ආපදාවන් සඳහා අවදානම් ප්‍රදේශවල ප්‍රජාව මෙන්ම එම

ප්‍රදේශවලට බාහිරින් පැමිණෙන දේශීය, විදේශීය සංචාරකයින් එම ස්ථානවල පවතින ආපදා අවදානම් තත්ත්වයන් පිළිබඳ දැනුවත් කිරීමට අදාළ තොරතුරු ප්‍රදර්ශනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. ඒ අනුව 2022 වර්ෂයේ ආපදා අවදානම් පුවරු සකස්කර ඒවා අදාළ ස්ථානවල ස්ථාපිත කිරීම පහත පරිදි සිදුකරන ලදි.

වගුව 4.2.2: ආපදා අවදානම් සහිත ප්‍රදේශවල ප්‍රජාව දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම

අනු අංකය	දිස්ත්‍රික්කය	පුවරු ප්‍රමාණය	ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
1	අම්පාර	14	ලාහුගල (1), පොතුවිල් (2), තිරික්කෝවිල් (1), අලයාඩිවෙම්බු (2), අඩලෙච්චෙනායී (4), සයින්දමරුදු (2), නයින්තවූර් (2)
2	ගාල්ල	06	බලපිටිය (1), මාදම්පාගම (1), හික්කඩුව (1), රත්ගම (1), කඩවත්සතර (1), හබරාදුව (1)
3	මඩකලපුව	06	කොරලේ පත්තු උතුර (1), මන්මුණේ පත්තු (1), කාත්තන්කුඩි (1), මන්මුණේ උතුර (1), එරාවූර් පත්තු (1), මන්මුණේ දකුණ සහ එරුවිල් පත්තු (1)
4	හම්බන්තොට	06	හම්බන්තොට (2), තංගල්ල (2), අම්බලන්තොට (1), තිස්සමහාරාම (1)
5	මාතර	06	මාතර (2), වැලිගම (2), දෙවිනුවර (2)
6	කෑගල්ල	07	දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවදානම් සහිත ස්ථානයන් හා මා ඔය ආශ්‍රිත අවදානම් ප්‍රදේශ
මුළු පුවරු ප්‍රමාණය		**45**	

<u>ආපදා කළමනාකරණය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන</u>

ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී විධිමත් ආපදා සන්නිවේදන ක්‍රමවේද අනුගමනය කරමින් ආපදා සන්නිවේදනයේ දී ප්‍රවෘත්ති වාර්තාකරණය තුළ මාධ්‍යවේදීන් මුහුණපාන ගැටලු අවමකර ගැනීම සහ තාක්ෂණික ආයතන සමඟ පවත්නා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම උදෙසා මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය ප්‍රශස්ත කිරීමට දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරයි. 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපාදන සීමා කිරීම මත ඊසානදිග මෝසම් වර්ෂාපතනය හා ආපදා සිදුවිය හැකි ආපදා අවදානම් පාදක කර ගෙන මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා වර්ල්ඩ් විෂන් (World Vision) ආයතනයේ මූල්‍ය ප්‍රතිපාදන සංවිධාන දායකත්වය සහිත වැඩසටහන් මාලාව සඳහා සම්පත් දායකත්වය සහ සම්බන්ධීකරණය දැනුවත් කිරීම් අංශය මඟින් සිදු කරන ලදි.




ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කය

<u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්</u>

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ට ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය තුළ මුහුණ දීමට ඇති අභියෝග ජය ගැනීම සඳහා එම නිලධාරීන්ගේ දැනුම හා අත්දැකීම් වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වන අතර ආපදා නිසා සිදුවන ජීවිත හා දේපළ විනාශය අවම කිරීම සඳහා ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරීව කටයුතු කරන එම නිලධාරීන්ට එම කාර්යයන් පහසුවෙන් සිදුකිරීම සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම වැදගත්වේ. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් 2022 වර්ෂයේදී සිදු කරන ලදි.

වගුව 4.2.3: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ ප්‍රමාණය
01	හදිසි ආපදා ප්‍රතිචාර ක්‍රියාකාරකම් සඳහා වෙබ් පාදක තොරතුරු සහ SOP බෙදා ගැනීම පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වූ වැඩසටහන	01	25
02	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක වෙත එක් වූ නවක ත්‍රිවිධ හමුදා සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන	01	09
03	ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා හදිසි අවස්ථාවලදී භාවිත වන උපකරණ ක්‍රියාකරවීම පිළිබඳ පුහුණු වැඩසටහන	01	15
04	ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා ඩ්‍රෝන උපකරණ හැසිරවීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන	01	18
05	ගබඩා කළමනාකරණය මූල්‍ය අංශයේ විෂය කටයුතු සම්බන්ධ නිලධාරීන් හට පුහුණුව	01	01
06	පරිසර කළමනාකරණ පද්ධතිය සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ දෙදින වැඩමුළුව (මෙම වැඩසටහන සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලෝක ආහාර සංවිධානය මඟින් ලබාදෙන ලදි)	01	02
07	ආපදා අවදානම් කළමනාකරණය සඳහා භූ අවකාශීය තාක්ෂණය භාවිතය පිළිබඳ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා කොළඹ දී දින 5ක අනේවාසික පුහුණු වැඩසටහන (මූල්‍ය දායකත්වය ලෝක ආහාර වැඩසටහන)- කොළඹ විශ්ව විද්‍යාලීය භූගෝල විද්‍යා අධ්‍යයන අංශය	01	15
08	ආපදා අවදානම් කළමනාකරණය සඳහා භූ අවකාශීය තාක්ෂණය භාවිතය පිළිබඳ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයන්හී නිලධාරීන් සඳහා දින 5ක නේවාසික පුහුණු වැඩසටහන (මූල්‍ය දායකත්වය ලෝක ආහාර වැඩසටහන) - කොත්මලේ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය	01	24
09	පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග විෂය නිර්දේශය ආවරණය වන පුහුණු වැඩහටහනක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන රියදුරන් සහ කාර්යාල සහයකයින් සඳහා වූ වැඩසටහන	01	15
10	ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යමණ්ඩල කළමනාකරණ සහකාරවරුන් සඳහා දමිළ භාෂා ප්‍රවීණතාව වැඩි දියුණු කර ගැනීමේ වැඩසටහන	01	39
11	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රියදුරන් සහ කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සඳහා දමිළ භාෂා ප්‍රවීණතාව වැඩි දියුණු කර ගැනීමේ වැඩසටහන	01	27
එකතුව		**11**	**190**

4.2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් - 2021 සහ 2022

වගුව 4.2.4: 2021 සහ 2022 වර්ෂවල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන්

	නිලධාරියාගේ නම	තනතුර	රට	කාලසීමාව	දින ගණන	වැඩසටහනේ නම
2021						
1	සුගත් දිසානායක	අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්)	ඉන්දියාව	2021 දෙසැම්බර් 20 - 22	දින 3	බිම්ස්ටෙක් රටවල් සඳහා ත්‍රිවිධ සේවා මානුෂීය ආධාර සහ ආපදා සහන අභ්‍යාසය (PANEX - 21)
2	කැප්ටන් (එස්එස්ඩි) එච්. එන්. එස්. පෙරේරා	ත්‍රිවිධ හමුදා සම්බන්ධීකාරක	ඉන්දියාව	2021 දෙසැම්බර් 20 - 22	දින 3	බිම්ස්ටෙක් රටවල් සඳහා ත්‍රිවිධ සේවා මානුෂීය ආධාර සහ ආපදා සහන අභ්‍යාස (PANEX - 21)
3	එච්. එම්. ඒ. සි. බණ්ඩාර	සහකාර අධ්‍යක්ෂ (කෑගල්ල)	ඉන්දියාව	2021 දෙසැම්බර් 20 - 22	දින 3	බිම්ස්ටෙක් රටවල් සඳහා ත්‍රිවිධ සේවා මානුෂීය ආධාර සහ ආපදා සහන අභ්‍යාස (PANEX - 21)
4	බ්‍රිගේඩියර් යූඒපී උබේසිරිවර්ධන	අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම්)	බංගලාදේශය	2021 ඔක්තෝබර් 26 - 28	දින 3	ආපදා ප්‍රතිචාර අභ්‍යාස සහ හුවමාරුව (DREE)
2022						
1	එස්. කෝකුලරාජන්	සහකාර අධ්‍යක්ෂ (කිළිනොච්චි)	තුර්කිය	2022 මැයි 16 - 23	දින 8	IORA-TIKA පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන "ආපදා අවදානම අවම කිරීම සඳහා ප්‍රජා නායකයින් සංවිධානය කිරීම" සහ "පශ්චාත් ආපදා තත්ත්වයන් තුළ බෝවන රෝගවලින් ආරක්ෂා වීම සහ සනීපාරක්ෂාව"
2	ඉෂාරා දිල්රුක්ෂි	දත්ත සමුදා විශ්ලේෂක	මොරිෂස්	2022 ජූනි 13 - 17	දින 5	IORA - UNITAR භූගෝලීය තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන (GIT)
3	කේ. තිලීපන්	සහකාර අධ්‍යක්ෂ (මන්නාරම)	හවායි	2022 අගෝස්තු 15 - 26	දින 12	ආපදා කළමනාකරණය සහ මානුෂීය ආධාර පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CFE-DM) විසින් පවත්වන ලද විශාල ජනගහනයක සෞඛ්‍ය හදිසි අවස්ථා (H.E.L.P) වැඩමුළුව
4	ඒ. එම්. ආර්. කේ. රත්නායක	සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්)	ඉන්දියාව	2022 අගෝස්තු 31 - 02 සැප්තැම්බර්	දින 3	පෘතුවි නිරීක්ෂණ දත්ත භාවිතයෙන් නියඟ අවදානම් තක්සේරු කිරීම සහ දකුණු ආසියාවේ නියඟ කළමනාකරණ පද්ධතිය (SADMS) දියත් කිරීම.
5	කේ. එම්. ජී. ටී. ඊ. වෛද්‍යරත්න	සහකාර අධ්‍යක්ෂ (සන්නිවේදන)	මොන්ගෝලියාව	2022 සැප්තැම්බර් 05 - 11	දින 7	2022 පැසිෆික් ඔරොත්තු දීමේ ආපදා ප්‍රතිචාර අභ්‍යාස සහ හුවමාරුව (DREE)
6	ඒ. ඒ. ඒ. කේ. කේ. සෙනෙවිරත්න	අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන)	තායිලන්තය	2022 සැප්තැම්බර් 27 - 29	දින 3	ආපදා ප්‍රතිසාධන ප්‍රමුඛතා පිළිබඳ කලාපීය වැඩමුළුව සහ ආසියාවේ ප්‍රතිසාධන සූදානම සඳහා වූ මාර්ග සිතියම
7	මහේන්ද්‍ර ජගත්	සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	බංග්ලාදේශය	2022 ඔක්තෝබර් 30 - නොවැම්බර් 03	දින 5	ආපදා ප්‍රතිචාර අභ්‍යාස සහ හුවමාරුව (DREE)

8	ජී. එම්. තනූජා සමන්මලී ප්‍රනාන්දු	සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන)	ජර්මනිය	2022 නොවැම්බර් 29 - 30	දින 2	අනතුරුදායක සිදුවීම් සහ ආපදා අලාභ හා හානි ලුහුබැඳීම පිළිබඳ තාක්ෂණික විශේෂඥ සංසදය
9	ඩබ්. පී. ඒ. කේ. තිලකරත්න	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)	මැනිලා, පිලිපීනය	2022 දෙසැම්බර් 05 සිට 07 දක්වා	දින 3	ආසියානු ආපදා සූදානම් කිරීමේ මධ්‍යස්ථානයේ (ADPC) කලාපීය උපදේශක කමිටුවේ (RCC) 17 වැනි කලාපීය රැස්වීම
10	බ්‍රිගේඩියර් ඩබ්. එල්. ඒ. සී. පෙරේරා	අධ්‍යක්ෂ (මෙහෙයුම්)	පකිස්ථානය	2022 දෙසැම්බර් 05 - 11	දින 7	6 වන ජාත්‍යන්තර ප්‍රජා හදිසි ප්‍රතිචාර කණ්ඩායම් / ස්වේච්ඡා කණ්ඩායම් අභියෝගය
11	ඊ. එම්. එල්. උදයකුමාර	සහකාර අධ්‍යක්ෂ (බදුල්ල)	පකිස්ථානය	2022 දෙසැම්බර් 05 - 11	දින 7	6 වන ජාත්‍යන්තර ප්‍රජා හදිසි ප්‍රතිචාර කණ්ඩායම් / ස්වේච්ඡා කණ්ඩායම් අභියෝගය
12	ගෘප් කැප්ටන් එම්. පී. එස්. මාරප්පෙරුම	ගුවන් හමුදා සම්බන්ධීකාරක	පකිස්ථානය	2022 දෙසැම්බර් 05 - 11	දින 7	6 වන ජාත්‍යන්තර ප්‍රජා හදිසි ප්‍රතිචාර කණ්ඩායම් / ස්වේච්ඡා කණ්ඩායම් අභියෝගය
13	කමාන්ඩර් ඩබ්. ජී. බී. මදුෂංක	නාවික හමුදා සම්බන්ධීකාරක	පකිස්ථානය	2022 දෙසැම්බර් 05 - 11	දින 7	6 වන ජාත්‍යන්තර ප්‍රජා හදිසි ප්‍රතිචාර කණ්ඩායම් / ස්වේච්ඡා කණ්ඩායම් අභියෝගය
14	ඒ. ඩබ්. සී. එල්. අඹේගොඩ	කළමනාකරණ සහකාර (රත්නපුර)	පකිස්ථානය	2022 දෙසැම්බර් 05 - 11	දින 7	6 වන ජාත්‍යන්තර ප්‍රජා හදිසි ප්‍රතිචාර කණ්ඩායම් / ස්වේච්ඡා කණ්ඩායම් අභියෝගය
15	ජේ. එම්. එස්. ජයවීර	අධ්‍යක්ෂ (පෙර සූදානම්)	නේපාලය	2022 දෙසැම්බර් 08 - 09	දින 2	බහු අන්තරායකාරී අවදානම් සහ අලාභ හා හානි තක්සේරු කිරීමේ රාමු උපදේශන සම්මන්ත්‍රණය

4.3 අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලද අතර අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදා හඳුනාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම, ආපදා කළමනාකරණ කටයුතු සඳහා පර්යේෂණ දායකත්වය ලබාදීම සහ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම යන වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වගකීම් සහ කාර්යභාරය ඉටුකිරීමට දායකත්වය ලබාදෙනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මූල්‍ය සහ භෞතික ප්‍රගති සාරාංශය පහත පරිදි වේ.

වගුව 4.3.1: 2022 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

වැය ශීර්ෂය	**ව්‍යාපෘතිය**	**2022 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රු. මී.)**	**මූල්‍ය ප්‍රගතිය (රු. මී.)**	**භෞතික ප්‍රගතිය (%)**
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	75	70.31	85%
10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	00	00	60%
7-2509	ආපදා අවදානම් තක්සේරුව	01	0.642	60%

4.3.1 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එහිදී එක් එක් වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙහිදී විවිධ වූ ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන මඟින් සිදුකරගැනීම සඳහා යොමුකෙරෙන අතර ප්‍රමුඛතාව මත අනෙකුත් ආපදා අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් කැඳවනු ලබන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනා සලකා බලමින් ජාතික මට්ටමින් පත්කරනු ලබන කමිටුවක් මඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තෝරාගනු ලබන අතර ඉන් අනතුරුව එම ව්‍යාපෘති යෝජනාවලට අදාළ විස්තරාත්මක තක්සේරු වාර්තා සහ අදාළ වන අනෙකුත් තාක්ෂණික වාර්තා ද සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර ජාතික මට්ටමින් ද ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. එක් එක් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන විවිධ වූ තාක්ෂණික දායකත්වයන් දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාළ තාක්ෂණික ආයතන මඟින් ලබාගනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මූල්‍ය සංසරණය සිදුකරනු ලබයි. ව්‍යාපෘතිය නිමකිරීමෙන් අනතුරුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකල බවට අදාළ තාක්ෂණික නිර්දේශයන් සමඟ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම් කර ගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 100 ක් 2022 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය මඟින් අනුමත කොට තිබුණ ද පසුව එය රු. මිලියන 75 ලෙස දෙවන කාර්තුව වන විට සංශෝධනය විය. කෙසේ වෙතත් පසුගිය වසර තුළ ඇතිවූ විවිධ ප්‍රායෝගික හේතූන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ඉල්ලුම්කරන ලද අක් මුදල් නොලැබීම් හේතුවෙන් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල අදාළ රු.මිලියන 46.06ක මුදලක් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම 2022 වසර සඳහා වෙන්වූ ප්‍රතිපාදන මඟින් සිදුකිරීමට සිදුවූ අතර 2021 වර්ෂයේ සිට 2022 වර්ෂය සඳහා අවිච්ඡේද වූ ව්‍යාපෘති නවයක් සඳහා රු. මිලියන 53.94ක ප්‍රතිපාදන වෙන්කිරීමට සිදුවිය. කරුණු එසේ හෙයින් ආරම්භයේදී 2022 වසර සඳහා එකදු නව ව්‍යාපෘතියක් හෝ ආරම්භ කිරීමට අවකාශ නොවිනි. අමුද්‍රව්‍ය හිඟතාවය සහ ක්ෂණිකව සිදුවූ මිල වැඩිවීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි බලපෑමක් සිදුකරන ලදී.

2022 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අවම කිරීමේ ව්‍යාපෘති යටතේ උක්ත ප්‍රතිපාදන වෙන්කිරීමට අදාළ ප්‍රගතිය අනුව රු. මිලියන 70.31ක මූල්‍ය ප්‍රගතියක් හා 85%ක භෞතික ප්‍රගතියක් වාර්තා කෙරේ. මින් 2021 වර්ෂයට අදාළ අතැති බිල්පත් ගෙවීම සඳහා රු. මිලියන 45.90ක මුදලක් සහ අවිච්ඡේද වූ ව්‍යාපෘති

සහ නව ව්‍යාපෘති සඳහා රු. මිලියන 24.41ක මුදලක් ගෙවා ඇත. අවිච්ඡේද කරන ලද ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති හතරක වැඩ අවසන් කර ඇති අතර භාණ්ඩාගාර චක්‍රලේඛ හා සංවර්ධන ව්‍යාපෘති සබැඳිව රජය විසින් ලබාදෙන ලද උපදෙස් ප්‍රකාරව අනෙකුත් ව්‍යාපෘතීන් නැවත්වීමට කටයුතු කරන ලදී. දෙසැම්බර් මාසයේ දී පැවති සීමිත ප්‍රතිපාදන සහ සීමිත කාල සීමාව සැලකිල්ලට ගනිමින් ආරම්භ කරන ලද කුඩා පරිමාණ නව ව්‍යාපෘති 6ක් ප්‍රතිපාදන ගෙවා තිබේ.

4.3.2 ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම

ආපදා කළමනාකරණ විෂය සාමූහික ක්‍රියාදාමයක් වියයුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යවශ්‍ය කාරණයක් වේ. ස්වභාවික සහ මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරකම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුව ඇත. ප්‍රායෝගිකත්වය සලකා බලමින් සෘජුවම ආපදා අවදානම් කළමනාකරණය සඳහා දායක කරගතයුතු කෂේත්‍ර 10ක් හඳුනාගෙන එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මේ අනුව පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා වන ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම අවසන්කර ඇත. මෙම මාර්ගෝපදේශ විෂයගත වන ආයතනවලට අදාළ වන විෂයධාරා මාර්ගෝපදේශයේ භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ලිඛිතව තහවුරු කර ගැනීමට යොමු කර ඇත. එම තහවුරුව ලැබීමෙන් අනතුරුව මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කරනු ලැබේ.

1. ජාතික සැලසුම් සම්පාදන
2. නාගරික සංවර්ධන
3. ජාතික සහ පළාත් මහාමාර්ග ඉදිකිරීම් හා සංවර්ධන
4. පළාත් පාලන
5. සංචාරක
6. පෞද්ගලික අංශය
7. සෞඛ්‍ය
8. ජල හා සනීපාරක්ෂාව
9. පාරිසරික බලපෑම් අධ්‍යන
10. දේශීය ආපදා කළමනාකරණ ක්‍රමෝපාය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් මෙම මාර්ගෝපදේශ මුද්‍රණය කර අදාළ ක්ෂේත්‍රවලට ලබාදීමට අපේක්ෂිත අතර එම මාර්ගෝපදේශ එක් එක් ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කිරීම පහසුකරණය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයන්ගේ මූලිකත්වයෙන් එම ක්ෂේත්‍රවලට අදාළ ආයතන තුළ ආපදා අවදානම් කළමනාකරණය අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ කමිටු සකස්කර එමඟින් උක්ත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දු කිරීමටත් මෙම වැඩසටහන පසුගමනීය කටයුතු සිදුකිරීමටත් අපේක්ෂා කෙරේ.

2022 වර්ෂය තුළදී, නාගරික සංවර්ධනයට සහ පාරිසරික බලපෑම් අධ්‍යනයට අදාළ මාර්ගෝපදේශ පිළිබඳ ඊට අදාළ ආයතන සමඟ මූලික සාකච්ඡා සිදුකර නිලධාරීන් දැනුවත්කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත් සංශෝධිත ප්‍රතිපාදන යටතේ මේ සඳහා කිසිදු මුදලක් වෙන් නොකිරීම නිසා මෙම කටයුතු ඉදිරියට සිදු කරගෙන යාමට බාධා වූ නමුත් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මූලික සාකච්ඡා සිදුකිරීමටත් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අදාළ සාකච්ඡා සඳහා සුදුසු නිලධාරී නාමයෝජනා ලබාගැනීමටත් කටයුතු කරන ලදි.

4.3.3 ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයතනික වගකීම් හා කාර්යභාරයන් සහ ජනතාවගේ අයිතීන් පිළිබඳ ලියවිල්ලක් සැකසීම

උක්ත කරුණට අදාළව ආපදා අවදානම් අවම කිරීම සඳහා ප්‍රධාන වශයෙන් කටයුතු කරනු ලබන සහ කටයුතු කළයුතු ආයතන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මූලික වැඩමුළුවක් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේහි දී පවත්වන ලද අතර මීට අදාළ මූලික ලියවිල්ල සකස්කර ඇත.

ඒ අනුව හඳුනාගත් ආයතන 52කට අදාළ අණපනත් සහ නීත්‍යානුකූල ලියකියවිලි පරිශීලනය කර (එවැනි මූලාශ්‍ර සොයාගැනීමට අපහසු අවස්ථාවන්හි දී ආයතනයේ වෙබ් අඩවිය පරිශීලනය කරන ලදී) එක් එක් ආයතනයේ මූලික වගකීම් සහ ආපදා අවදානම් අවමකිරීම සහ ආපදා කළමනාකරණය හා සබැදි වගකීම් කෙටුම්පත් කරන ලදී.

මෙසේ කෙටුම්පත් කරන ලද ලියවිල්ල අදාළ ආයතන සමඟ සාකච්ඡාකර එකඟතාවයන් ඇතිකර ගැනීමෙන් පසුව සම්පූර්ණ ලියවිල්ලක් ලෙස සකසා මුද්‍රණය කර දැනුවත් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂිතයි. ඒ අනුව කෙටුම්පත් කර ඇති ලියවිල්ල සඳහා අදාළ ආයතනයන්ගේ යෝජනා සහ එකඟතාවය ලබාගැනීම සඳහා 2022 නොවැම්බර් මස 24 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද අතර මේ සඳහා දැනට සකස් කර ඇති ආයතන 52කට අදාළ ආයතන මෙන්ම තවත් ආයතන 18ක නිලධාරීන් ද ඇතුළුව ආයතන 70ක නිලධාරීන් සහභාගී විය. ඒ අනුව වැඩමුළුවේ දී ලබාගන්නා ලද අදහස් හා යෝජනා ඇතුළත් කර සංශෝධිත කෙටුම්පත් නැවතත් ආයතනවලට යවා තහවුරු කරගැනීම් සිදු කිරීම මේ වන විට සිදු කෙරෙමින් පවතී. මේ සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සංශෝධිත අයවැය මඟින් වෙන් නොවූව ද UNDP මූල්‍ය සහය මත වැඩමුළුව පවත්වන ලදි.



2022 නොවැම්බර් මස 24 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද වැඩමුළුව

4.3.4 ආපදා අවදානම් තක්සේරුව

රට තුළ සිදුවී ඇති ආපදා, කාලගුණ සහ දේශගුණික රටා, භූ විෂමතා, ආර්ථික සමාජීය සහ භෞතික පසුබිම, ආදී විවිධ වූ කරුණු පදනම් කරගනිමින් ආපදා අවදානම් තත්ත්වයන් පිළිබඳ යම් පුරෝකථනයක් විද්‍යාත්මකව සිදුකිරීමේ හැකියාවක් පවතින අතර මේ සඳහා විවිධ වූ තාක්ෂණික ආයතන මඟින් සිදුකරනු ලබන පරීක්ෂණ, වාර්තා ආදිය ද ඉවහල් වේ. එමෙන්ම ආපදා තත්ත්වයක් ඇතිවුව හොත් එක් එක් ආපදාව අනුව ගොදුරුවිය හැකි ප්‍රදේශ, ආරක්ෂිත ස්ථාන ආදී විවිධ වූ තොරතුරු විධිමත්ව නවීන තාක්ෂණය භාවිත කරමින් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන්ට පරිශීලනය කළහැකි පරිදි සැකසීම ද ඉතාමත් වැදගත් කාරණයක් වේ. එමෙන්ම ආපදා අවදානම් තක්සේරුවට අදාළ තොරතුරු මඟින් ආපදා කළමනාකරණයට අදාළ විවිධ වූ තීරණවලට එළඹීම සහ වැඩසටහන් සැලසුම් කිරීම ද පහසුකරවනු ලැබේ.

<u>තෝරාගත් නගර 10ක් තුළ ආපදා අවදානම් තක්සේරුකරණය</u>

තෝරාගත් නගර 10ක් තුළ (ගම්පහ, මීගමුව, මන්නාරම, කළුතර, කඩුවෙල, කොලොන්නාව, මොරටුව, වැල්වැටිතුරෙයි, පේදුරුතුඩුව සහ චාවකච්චේරි) ආපදා අවදානම් තක්සේරුකරණය සඳහා බිම් මට්ටමේ දත්ත ඒකරාශී කිරීම අවසන් කර ඇති අතර නගර 10ට අදාළ දත්ත පරිගණකගත කිරීම ද අවසන් කර ඇත. මීට අදාළ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර උවදුරු සිතියම්කරණය, පාත්‍රතාවය ගණනය කිරීම සහ අවදානම් ගණනය කිරීම අවසන්කර ඇත.

ඒ අනුව අදාළ සිතියම් පිළිබඳ බිම් මට්ටමේ තහවුරු කිරීම් සිදුකිරීම 2022 වර්ෂය තුළ සැලසුම්කර තිබූ නමුත් වසර ආරම්භයේ දී රටෙහි පැවති විශේෂිත තත්ත්වයන් හේතුවෙන් සහ පසුව සංශෝධිත අයවැය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය.

<u>අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම</u>

ජාතික මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාසල් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින්ම අවස්ථා ගණනාවකදීම ඉස්මතුවූ අතර එය කාලීන අවශ්‍යතාවයක් ද විය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ පාසල් සඳහා අවදානම් දර්ශකයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් සිදුකිරීමට මෙම අංශය කටයුතු කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදුකිරීමෙන් අනතුරුව අධ්‍යාපන කලාප අධ්‍යක්ෂකවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කර උක්ත අවදානම් දර්ශකය සැකසීම සඳහා දත්ත ඒකරාශී කිරීමට අදාළ ප්‍රශ්නාවලි හරහා තොරතුරු එකතු කිරීම අවසන්කර ඇත. විශේෂයෙන්ම 2022 වර්ෂය මීට අදාළව සිදුකරන ලද කාර්යයන් පහත පරිදි පෙන්වා දිය හැකිය.

- ප්‍රශ්නාවලි නොලද පාසල්වල ලැයිස්තු දිස්ත්‍රික් මට්ටමින් සකස් කර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක වෙත යවා ප්‍රශ්නාවලි එකතු කිරීම අවසන් කරන ලදි. මෙහිදී ප්‍රශ්නාවලි අස්ථානගතව තිබූ පාසල් සඳහා Google Form භාවිතයෙන් නැවතත් ප්‍රශ්නාවලියක් සකස් කර ඒ හරහා එම පාසල්වල තොරතුරු ද ලබාගන්නා ලදි.
- එකතුකරන ලද සියළුම ප්‍රශ්නාවලි තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර අවසන් කරන ලදි.

- Access භාවිතයෙන් දත්ත ඇතුළත් කිරීමට පහසුවන පරිදි සකස් කර තිබූ දත්ත පද්ධතිය භාවිතයෙන් වෙන වෙනම දත්ත ඇතුළත් කර තිබූ දත්ත පද්ධති 54ක් එක් දත්ත පද්ධතියක් ලෙස සකස් කිරීම සිදු කරන ලදි.
- අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් පවත්වා ඔවුන්ගේ මූලික පාසල් දත්ත පද්ධතිය ලබාගෙන එම දත්ත පද්ධතියේ යාවත්කාලීන වන තොරතුරු අප දත්ත පද්ධතියට පහසුවෙන් ඇතුළත් කිරීමට හැකිවන පරිදි පාසලේ Census Number තීරුව අප දත්ත පද්ධතියට ඇතුළත් කරන ලදි.
- ඒ අනුව පාසල් 10,157කින් යුත් පාසල් දත්ත පද්ධතියේ මූලික තොරතුරු සියල්ල මේ වන විට සම්පූර්ණ කර තිබේ.
- ඊට අමතරව අවදානම් තක්සේරුව සඳහා වැදගත් වන සමහර ප්‍රශ්න සඳහා සමහර පාසල්වලින් ප්‍රශ්නාවලි සමීක්ෂණයේ දී තොරතුරු සපයා නොමැති බව හඳුනාගන්නා ලදි. මේ වන විට දත්ත පද්ධතියේ එම අඩුපාඩු හඳුනාගනිමින් අසම්පූර්ණ තොරතුරු සම්පූර්ණ කිරීම නැවතත් පාසල් විදුහල්පතිවරුන්ට දුරකතන ඔස්සේ ඇමතුම් ලබාදී සම්පූර්ණ කිරීම මෙම අංශයේ නිලධාරීන් සහ වරින් වර සීමාවාසික පුහුණුව සඳහා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන් යොදාගනිමින් සිදුකරමින් පවතී.

අවදානම් තක්සේරුකරණය සිදුකිරීම සඳහා පූර්ණ දත්ත පද්ධතියක අවශ්‍යතාවය පවතින නිසා පවතින මානව සම්පත් උපරිමයෙන් භාවිත කරමින් එම දත්ත පද්ධතිය සම්පූර්ණ කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවති. මේ සඳහා සීමාවාසික පුහුණුව යටතේ සම්බන්ධ වූ විශ්වවිද්‍යාල සිසුන්ට ගෙවීම් සඳහා රු. මිලියන 0.5235ක මුදලක් වැය කර තිබේ.

අවදානම් තක්සේරුව සිදුකිරීමෙන් අනතුරුව, පාසල් තුළ ආපදා අවදානම හඳුනාගැනීම සහ ප්‍රමුඛ කිරීම ආපදා අවදානම අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීමේදී වැදගත් වන අතර ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ තාක්ෂණික ප්‍රවේශයන් සඳහා ද මහෝපකාරී වනු ඇත.

<u>ආපදා අවදානම් අවම කිරීම සඳහා අධි අවදානම් සහිත ක්ෂේත්‍ර හඳුනාගනිමින් ආපදා අවදානම් තක්සේරු සිදුකිරීමේ වැඩසටහන</u>

සෙන්දායි රාමුව අනුව වන ගෝලීය ක්‍රියාවලිය තුළ මෙන්ම දේශීයව ආපදා අවදානම් අවම කිරීම සඳහා වන උපාය මාර්ග සැලැස්ම අනුව ද වසර 2030 වනවිට ආපදාවන්ගෙන් සුරක්ෂිත වුත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම අරමුණු කරගත්තාවුත් ක්‍රියාවලියක අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ අනුව ආපදා පාත්‍රතාවයට වැඩි සම්භාවිතාවක් පවතින ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සඳහා තාක්ෂණික ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුනාගන ඇත. මෙහිදී විවිධ අවශ්‍යතා සහිත දරුවන් ජීවත්වන විශේෂිත රැකවරණ මධ්‍යස්ථාන, ළමා නිවාස, වැඩිහිටි නිවාස පිළිබඳව සැලකීමේදී මොවුන් ආපදාවකට ගොදුරුවීමේ වැඩි හැකියාවක් ඇති පිරිසක් වන බැවින් මොවුන්ගේ ආපදා අවදානම තක්සේරු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර එම තක්සේරුව අනුව ආපදා අවදානම් අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත.

ඒ අනුව 2020 වර්ෂය තුළ උක්ත කණ්ඩායම් පිළිබඳ ජාතික මට්ටමින් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා උක්ත ක්ෂේත්‍රවලට අදාළ ද්විතීක දත්ත ඒකරාශී කිරීමෙන් අනතුරුව ප්‍රශ්නාවලි නිර්මාණය කර දත්ත ඒකරාශී කිරීම ආරම්භ කරන ලදී.

මේ වන විට දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි නිලධාරීන් දැනුවත් කර ප්‍රශ්නාවලි බෙදාහැරීම, දත්ත ඒකරාශී කිරීම සහ දත්ත පරිගණකගත කිරීම අවසන්කර ඇත. මෙම දත්ත භාවිත කරමින් අවදානම් දර්ශකය නිර්මාණය කිරීම සඳහා වන ක්‍රමවේද සකස්කිරීම මේ වනවිට සිදුකෙරෙමින් පවතී.

<u>අවදානම් තක්සේරුව පාර්ශවකාර ආයතන තුළ භාවිතය පිළිබඳ ප්‍රශ්නාවලි සමීක්ෂණය</u>

විවිධ අංශ නියෝජනය කරන පාර්ශවකාර ආයතන විසින් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අවදානම් තක්සේරු ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමට සවිස්තරාත්මක ප්‍රශ්නාවලියක් Google form භාවිතයෙන් සකස් කර පාර්ශවකාර ආයතන 132කට යවන ලදී. විශේෂයෙන්ම පාර්ශවකාර ආයතනවල අවදානම් තක්සේරුවේ අරමුණු හඳුනාගැනීම, අවදානම් තක්සේරුව සිදු කිරීමේ නෛතික රාමුව, තක්සේරුව සිදු කිරීම සහ සිතියම්කරණය සඳහා යොදාගනු ලබන ක්‍රමවේදයන් හඳුනාගැනීම, අවදානම් තක්සේරුව සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදන ආකාරයන් හඳුනාගැනීම සහ අවදානම් තක්සේරුවේ සංවර්ධනය විය යුතු අංශ පිළිබඳ හඳුනාගැනීම යනාදී කරුණු අරමුණු කරගනිමින් මෙම ප්‍රශ්නාවලිය ගොඩනගා තිබේ.


ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
Disaster Management Centre

Section 1 of 17

SURVEY ON THE STATUS OF DISASTER RISK ASSESSMENT IN SRI LANKA

In the following pages you will find a detailed questionnaire which will be used in order to develop a risk assessment methodology that will be feasible and easy to implement by the partners represent different sectors.The purpose of the questionnaire is to:

a. Create a better understanding on the expectations and objectives of the different sectors on disaster risk assessment methodology
b. Collect information concerning the existing situation in each individual institution regarding the legal requirements and the methods they have been using for assessing and mapping disaster risk;
c. Examine the availability and accessibility of data that are essential to implement the disaster risk assessment and to produce risk maps and;
d. Provide a basis for developing the new risk assessment methodology based on sector requirements


The questionnaire only takes into account hazard types that are related to climate variability and change (e.g. floods, landslides, cyclone etc.). Thus information regarding technological and industrial hazards are not required. Please complete carefully the following sections and do not hesitate to contact the Disaster Management Center, Mitigation Research and Development Division in case you have any questions.
This link (https://www.dropbox.com/s/6w97ogsn0c52sj5/APPENDIX%20I.pdf?dl=0) provides a glossary which you can find the definitions of the most common terms in risk assessment that are also used throughout the questionnaire. At this stage of the survey, it is requested to provide information regarding the availability and accessibility of the different data.

DISASTER MANAGMENT CENTRE / MITIGATION, RESEARCH & DEVELOPMENT UNIT / TEL : 0112 136 141 / 0770682970

ඒ අනුව ආයතන 48කින් නැවත ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර අප වෙත ලබාදී තිබේ. මේ සම්බන්ධ වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු 2023 වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර තිබේ.

4.3.5 දුරස්ථ සංවේදය මත පදනම් වූ කැලෑගිනි හානි ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම


වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් ඔස්සේ කැලෑගිණි හේතුවෙන් ඇතිවන හානිය චන්ද්‍රිකා ඡායාරූප හා Google Earth Engine යොදාගනිමින් පහසුවෙන් ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මෙය UN Spider මඟින් ලබාදෙන ලද උපදේශක දීපා මෙනෙවියගේ සහයෝගය ඇතිව සිදු කරන ලදී.



චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණයෙන් හඳුනාගනු ලැබූ කැලෑ ගිනි හානියක්


4.3.6 දෛනික කැලෑ ගිනි පසුවිපරම් කිරීමේ Online GIS පද්ධතිය නිර්මාණය කිරීම

Fire Information for Resource Management System, NASA වෙබ්අඩවිය මඟින් ලබාදෙනු ලබන තත්කාලීන කැලෑගිනි ස්ථානීය දත්ත ඇතුළත් කර Online GIS පද්ධතිය නිර්මාණය කිරීම. මෙහිදී හදිසි මෙහෙයුම් අංශයට ප්‍රයෝජනවත් වන පරිදි මෙම පද්ධතියට වනාන්තර සහ වනජීවී කලාප අවකාශීය දත්ත මෙන්ම පරිපාලන මායිම් අවකාශීය තොරතුරු (දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, පළාත් පාලන සහ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාස) ඇතුළත් කර සකස් කර තිබේ. ඒ අනුව දෛනික කැලෑ ගිනි ඇතිවන ස්ථානයන් පහසුවෙන් හඳුනාගැනීමටත් එම ස්ථානයන්ට අදාළ ඉහත තොරතුරු ඉතා පහසුවෙන් ලබාගැනීමටත් මෙම පද්ධතිය ඔස්සේ හැකියාව පවතී.



4.3.7 ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම

ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරු කිරීමට අදාළ කටයුතු මෙම අංශය මඟින් ඉටුකෙරෙන අතර ඒ සඳහා දත්ත යාවත්කාලීන කිරීමට ක්‍රමවේද නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් ක්ෂේත්‍රයන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම ද මේ යටතේ සිදුකරනු ලැබේ. පාර්ශවකාර ආයතන නියෝජිතයින් සඳහා අභිමිවීම් හා හානි පිළිබඳ ගොඩනගා ඇති දත්ත පද්ධතියේ පරිශීලක එකඟතා පරීක්ෂණය (User Acceptance Testing) සිදු කිරීමට සැලසුම් කර ඇති නමුත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම කාර්යයන් සඳහා බාධා විය.




"Historical disaster information system in Sri Lanka" ග්‍රන්ථය සකස් කිරීම

1974 සිට 2020 වර්ෂය දක්වා සිදුවන ලද ආපදා අවස්ථාවන්ට අදාළ දත්ත හා තොරතුරු ඇතුළත් කරමින් මෙම ග්‍රන්ථය සකස් කර තිබේ. විශේෂයෙන්ම Desinventra දත්ත ගබඩාවට ඇතුළත් කර ඇති දත්ත විශ්ලේෂණය තුළින් මෙම වාර්තාව සකස් කර ඇති අතර වගු, ප්‍රස්තාර සහ සිතියම් ආකාරයෙන් දත්ත නිරූපණය කෙරේ. මේ තුළින් ශ්‍රී ලංකාවේ ආපදා සම්බන්ධයෙන් ප්‍රළුල් අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබේ.

4.3.8 Desinventra දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම

ආපදා අවදානම් අවම කරමින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම පර්යේෂණ කටයුතු පියවරෙන් පියවර දීර්ඝ කාලීනව පුළුල් පරාසයක් තුළ විහිදීයන ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළයුතු වේ. මෙහිදී ආපදා අවදානම් අවම කරගැනීම පිළිබඳ අධ්‍යන සඳහා පාදක කරගැනීමට නිවැරදිව යාවත්කාලීන වන දත්ත පදනමක් අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම අවශ්‍යතාවය හඳුනාගත් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් 2008 වසරේ සිට **Desinventar** දත්ත ගබඩාව පවත්වාගන යනු ලබයි. මෙම සියලු දත්ත අන්තර්ජාලය තුළ විවෘතව පවතින අතර මෙම දත්ත අවශ්‍ය ඕනෑම අයෙකුට අන්තර්ජාලය මඟින් නොමිලේ ලබාගැනීමේ පහසුකම ලබාදී ඇත.



Desinventar දත්ත පද්ධතියේ දත්ත රැස් කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventar.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව අදාළ ආපදාවන් යටතේ අදාළ කාලයන් තුළ සිදුවූ මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපළ පිළිබඳ තොරතුරු සංඛ්‍යාත්මක වශයෙන් මෙම දත්ත පද්ධතියට ඇතුළත් කරඇත.

රූපසටහනේ දැක්වෙන දත්ත රැස්කරන සහ යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයට අනුව දින 15ට වරක් මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන වේ. ඊට අමතරව පොලිස් වාර්තා (www.police.lk) මඟින් ලබාගන්නා තොරතුරු ද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

4.3.9 riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)

භූ අවකාශීය දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ අවකාශීය දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිත කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණ ගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි.

කිසිදු අයකිරීමකින් තොරව අන්තර්ජාලය හරහා මෙම දත්ත ලබාගත හැකි අතර එමඟින් ආපදා කළමනාකරණය පිළිබඳ කටයුතු කරනු ලබන ආයතන සහ පුද්ගලයින් සඳහා සහයවීමත් පර්යේෂණ කටයුතු සඳහා දිරිමත් කිරීමත් සිදුකරනු ලබයි. විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා ලබාදීම ද මේ හරහා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් සිදුකරනු

ලබන අතර එමඟින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා නව මානව සම්පත් බිහිවීම ද මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස හැදින්විය හැක.

4.3.10 මෝසම් සිතියම් නිර්මාණය

මෝසම් වර්ෂාවට පෙර සුදානම් වීම සඳහා ඊට අදාළ දත්ත පදනම්ව සිතියම් නිර්මාණය කිරීම මෙන්ම මෝසම් වර්ෂාවෙන් පසුව ඊට අදාළ සිතියම් නිර්මාණය කිරීම ද සිදුකර ඇත.

4.3.11 චන්ද්‍රිකා ඡායාරූප භාවිතකර ආපදාවට පාත්‍ර වූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම

ආපදා පෙර සුදානම් වීම සඳහා මෙන්ම හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම් සඳහා, ආපදා සිදුවිය හැකි සහ ආපදා සිදුවී ඇති ප්‍රදේශ මෙන්ම ආපදාවට ලක්වූ පිරිස් පිළිබඳ දත්ත ඉතාමත් වැදගත් සාධකයක් වේ. මෙම දත්ත ලබාගැනීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් තොරතුරු අනාවරණය කිරීම ආපදා අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් කටයුතු කරනු ලැබේ. මෙහිදී කාලගුණ අනාවැකි පදනම් කර ගනිමින් ආපදා ඇතිවීමට පෙර සහ ආපදා ඇතිවීමෙන් පසු චන්ද්‍රිකා ඡායාරූප ලබාගෙන එම ඡායාරූප විශ්ලේෂණය මඟින් පවතින ද්විතීක දත්ත පදනම් කරගනිමින් උක්ත තොරතුරු ලබාගැනීමට කටයුතු කෙරේ.

ජාත්‍යන්තර චන්ද්‍රිකා තාක්ෂණ ආයතන මඟින් මෙම ඡායාරූප ලබාගන්නා අතර ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විශේෂිත අවස්ථාවක් ‘‘ඉන්ටනැෂනල් චාටර්’’ (International Charter) සහ ‘‘සෙන්ටිනල් එශියා’’ (Sentinel Asia) යන ආයතන මඟින් ලබාදී ඇති අතර ආපදාවකට පෙර හෝ ආපදා අවස්ථාවේදී නිසි ක්‍රමවේද ඔස්සේ මෙම ආයතන වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආපදා අවදානම් ප්‍රදේශ ආවරණය වන පරිදි චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම සිදුකෙරෙන අතර ආපදාවට පෙර සහ පසු ඡායාරූප ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමට කටයුතු කෙරේ. තාක්ෂණික උපාංග භාවිතයෙන් මෙම ඡායාරූප විශ්ලේෂණය කර අදාළ ආපදා ප්‍රදේශ හඳුනාගැනීම ඉන් අනතුරුව සිදුකරනු ලැබේ.

මේ වසරේදී නව චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම් සිදු නොකලද පෙර ලබාගන්නා ලද ඡායාරූප යොදාගනිමින් වරින් වර අවශ්‍යතාවයන් සඳහා ගංවතුර ආපදා සිතියම් සකස් කිරීම සිදුකරනු ලැබීය.

4.3.12 දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවමකිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත. මෙහිදී මෙම ලිපි සඳහා විසඳුම් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමුකරමින්, පවතින නීති රෙගුලාසි සහ ධාරිතාවයන් අනුව තාක්ෂණික නිර්දේශයන් ද සලකා බලමින් ජනතාව අපේක්ෂා ඉටුකිරීමට දායකවීම අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පරමාර්ථය වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළ වන ඉල්ලීම් සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හරහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකර එම පරීක්ෂණ වාර්තා පදනම්

කරගනිමින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිසි ක්‍රමවේදයන් අනුව තීන්දු තීරණ ලබාගත අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මෙහිදී එක් එක් කාරණය අනුව ඊට අදාළ තාක්ෂණික ආයතනය සහ රේඛීය අමාත්‍යාංශය වෙත උක්ත ඉල්ලීම් යොමුකිරීම ද සිදුකෙරෙන අතර සෑම ලිපි ගනුදෙනුවකදීම ඉල්ලුම්කරු වෙත පිටපතක් යොමු කරමින් ඉල්ලුම්කරු දැනුවත් කිරීම සිදුකරනු ලබයි.

යොමුකරන ලද සෑම ලිපියකටම ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇති අතර සෘජුවම සිදුකළ හැකි මහපෙන්වීම් සහ තාක්ෂණික දැනුවත් කිරීම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ඉල්ලුම්කරු වෙත සිදුකර ඇත. 2022 වර්ෂයේ අවසානය වනවිට ලැබී ඇති සියලුම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

4.3.13 වෙනත් ආයතන සමඟ සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

<u>ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි (JICA) සහය ඇතිව, කැළණි ගංගා ද්‍රෝණිය තුළ ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රණය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය</u>

මෙම ව්‍යාපෘතිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) මූල්‍ය හා තාක්ෂණික සහය ඇතිව ශ්‍රී ලංකාවේ ගංඟා ද්‍රෝණි සංවර්ධන සැලැස්ම මත පදනම්ව ආපදා අවදානම් අවම කිරීම ප්‍රාදේශීය පරිපාලන සංවර්ධන යාන්ත්‍රණය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ අරමුණින් සිදුකරනු ලබයි. කැලණි ගංඟා ද්‍රෝණිය ආවරණය වන කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04ක් සහ ඒ හා සමපාත පළාත් පාලන ආයතන 04ක් තෝරාගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම මේ සඳහා සියලු පාර්ශවකාර ආයතනය නියෝජිතයෙන් තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමක් ද පිහිටුවා තිබේ.

මෙම ව්‍යාපෘතියට අදාළව සම්බන්ධීකරණ (JCC)කමිටු රැස්වීම් දෙකක් සහ තාක්ෂණික ක්‍රියාකාරී කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නියමු පළාත් පාලන ආයතන දැනුවත් කිරීම සඳහා එක්දින වැඩමුළුවක් පවත්වන ලදි. ඊට අමතරව සෑම පළාත් පාලන ආයතනයකම ආයතන සභාපතිවරුන් හා අදාළ නිලධාරීන් සමඟ ආයතනවලටම ගොස් අවස්ථා කිහිපයක දී සාකච්ඡාවන් පවත්වන ලද අතර ආපදා අවදානම් ප්‍රදේශ සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ ද සිදුකරන ලදි. තවද ආපදා අවම කිරීම ප්‍රාදේශීය යාන්ත්‍රනය තුළට ඇතුළත් කිරීමේ දී වැදගත් වන ප්‍රවේශයන් හඳුනාගැනීමට පළාත් පාලන ආයතනයන්හි කාර්යය මණ්ඩලවල භූමිකාවන් සහ වගකීම් සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් හරහා තොරතුරු රැස් කරන ලද අතර මෙහි වාර්තාව මේ වනවිටත් කෙටුම්පත් කිරීම අවසන් කර තිබේ. ඒ අනුව මෙම වාර්තාව සම්බන්ධයෙන් අවසන් එකඟතාවයකට එළඹීම තෙවන ක්‍රියාකාරී කණ්ඩායම් කමිටු රැස්වීමේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත. එසේම මෙම ප්‍රශ්නාවලි සමීක්ෂණය හරහා ලබාගන්නා ලද තොරතුරු පළාත් පාලන ආයතන නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගැනීමට ද භාවිත කරන ලදි.

තවද මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතිවලදී ආපදා අවදානම අවම කිරීම සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් සකස් කිරීම ද සිදු කරනු ලබයි. එහිදී විශේෂයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති යෝජනා ආකෘතියේ ආපදා

අවදානම් අවම කිරීම සම්බන්ධ ප්‍රශ්නය පාදක කරගනිමින් ඒ සඳහා මෙම මාර්ගෝපදේශය සකස් කරන අතර මේ වන විටත් එම ආයතනය හා අවස්ථා කිහිපයකදීම සාකච්ඡා වාර කිහිපයක් සිදුකර තිබේ. මෙම මාර්ගෝපදේශය කෙටුම්පත් කිරීම JICA විශේෂඥ කණ්ඩායමේ සහයෝගය ඇතුව මේ වන විට සිදුකරමින් පවතී.





2022 සැප්තැම්බර් 1 වන දින 2වන ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව (JCC Meeting)



නියමු පළාත් පාලන ආයතන (LA) සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වැඩමුළුවක් 2022 සැප්තැම්බර් 8 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.



කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ඇතුළු කාර්යමණ්ඩලයට ව්‍යාපෘතිය පිළිබඳ පැහැදිලි කිරීම



නිමැවුම 2හි ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡාව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD) සඳහා වන මාර්ගෝපදේශය පිළිබඳ අදහස් දැක්වීම



නිමැවුම 1 ක්‍රියාකාරකමේ කොටසක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) සාමාජිකයා සම්මුඛ පරීක්ෂණය කිරීම.

<u>දැනුම වැඩි දියුණු කිරීම තුළින් ආපදාවලට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීමේ UNDP ව්‍යාපෘතිය - වාරි අංශය</u>

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - UNDP මූලිකත්වයෙන් සිදුකෙරෙන ආපදා-ප්‍රතිරෝධී යටිතල පහසුකම් ස්ථාපනයට සැලසුම් ක්‍රියාවලිය සඳහා වැඩි ආයෝජනයක අවශ්‍යතාවය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය ඇතිව බැංකොක් ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරහා දැනුම වැඩිදියුණු කිරීම තුළින් ආපදාවලට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය දියත් කර ඇත.

ව්‍යාපෘතියේ ආරම්භය 2022 මාර්තු 30 වන දින වන අතර ප්‍රථම තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2022 ජුනි 15 වන දින සියලුම තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයින්ගේ සහ ව්‍යාපෘතියේ උපදේශකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

වාරිමාර්ග අංශය සඳහා පූර්ව ආපදා පදනම සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ දෙවන පියවර වශයෙන් සිදු කරන ලදි. මෙම ක්‍රියාවෙහි ප්‍රධාන අරමුණ වූයේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ පූර්ව ආපදා පදනම සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති උපදේශකයින්ට සහ ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට ‘‘දැනුම වැඩි දියුණු කිරීම තුළින් ආපදාවලට ඔරොත්තු දීමේ යටිතල පහසුකම් ගොඩනැගීම’’ ව්‍යාපෘතිය පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීමට වේදිකාවක් සැකසීමයි.

ව්‍යාපෘති පාර්ශවකරුවන් සඳහා පළමු පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු කිරීමේ පුහුණු වැඩසටහන 2022 සැප්තැම්බර් 13 සහ 14 යන දිනවල සිදු කරන ලදි. පුහුණුවේ අරමුණ වූයේ පාර්ශවකරුවන්ට පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව (Post Disaster Need Assessment) සහ ආපදා ප්‍රතිසාධන රාමුව (Disaster Recovery Framework) මූලික දැනුමක් ලබා දීමයි. වාරිමාර්ග අංශය සඳහා ආපදා මූලික දත්ත කට්ටලය (Pre Disaster Baseline Dataset), වාරිමාර්ග යටිතල පහසුකම් සඳහා ආපදා ප්‍රතිසාධනයට මූල්‍ය සූදානම හඳුන්වාදීම සහ වාරිමාර්ග යටිතල පහසුකම්වල පශ්චාත් ආපදා ප්‍රතිසාධනය පිළිබඳ වත්මන් තත්ත්වය සහ අත්දැකීම් බෙදාගැනීම සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා කරන ලදි.


දෙවන පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු කිරීමේ පුහුණු වැඩසටහන 2022 නොවැම්බර් 9 සහ 10 යන දිනයන්හිදී පවත්වන ලද අතර, මෙම පුහුණු වැඩසටහනට PDNA ක්‍රමවේදය අවබෝධ කර ගැනීම, වාරිමාර්ග ක්ෂේත්‍රයේ PDNA සිදු කිරීමේ සම්මත ක්‍රියා පටිපාටි අවබෝධ කර ගැනීම, පාර්ශවකරුවන් සමඟ සිද්ධි අධ්‍යයන තොරතුරු සහ ව්‍යාපෘති තොරතුරු බෙදාගැනීම සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීම ඇතුළත් විය. එසේම වාරිමාර්ග අංශය සඳහා පශ්චාත් ආපදා හානි සහ අලාභ දත්ත ගබඩාව සංවර්ධනය කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය පියවර ගෙන තිබේ.

4.4 හදිසි මෙහෙයුම් අංශය (Emergency Operations Division)

ශ්‍රී ලංකාව තුළ සිදුවිය හැකි ආපදාවකදී ජීවිත, දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම, හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා පැය 24 පුරා අඛණ්ඩ සේවයක් ලබා දෙන අංශය ලෙස හදිසි

මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වන අතර එය සිවිල් නිලධාරීන් මෙන්ම ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ගෙන් ද සමන්විත වේ.

සිදුවිය හැකි ආපදා සඳහා පූර්ව අනතුරු ඇඟවීම, ප්‍රචාරණය කිරීමට අදාළ සියලු ක්‍රියාකාරකම් සිදුකර අනතුරුවලින් ජීවිත හා දේපළ බේරා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණයත්, අනතුරක් සිදු වන අවස්ථාවේදීත් ඉන් පසුවත් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, මුදවා ගැනීම හා බේරා ගැනීම සඳහා අවශ්‍ය ආයතනික සම්බන්ධීකරණයන් සිදු කිරීම මෙම අංශයේ මූලික වගකීම ලෙස දැක්විය හැක. පළමු ප්‍රතිචාර දක්වන්නන් හා අනෙකුත් පාර්ශවකාර ආයතන සමඟ හා ප්‍රජාවන් සමඟ සම්බන්ධීකරණය වී ආපදාවෙන් ජීවිත බේරාගැනීමේ මූලික අරමුණින් යුතුව කටයුතු සැලසුම් කිරීම හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරයි. හදිසි මෙහෙයුම් අංශයට අදාළව ස්ථාපිත 117 හදිසි ඇමතුම් මැදිරිය හරහා සියලු ප්‍රජාවන්ට අවශ්‍ය ආපදාවන්ට අදාළ ක්ෂණික තොරතුරු අඛණ්ඩව ලබා දීම සිදු කරනු ලබයි.



හදිසි මෙහෙයුම් මැදිරිය

4.4.1 ආපදා සාරාංශය - 2022

වගුව 4.4.1: 2022 වසරේ සිදු වූ ආපදා සාරාංශය

ආපදාව	සිදුවීම් ගණන	මරණ සංඛ්‍යාව	තුවාල වූවන්	අතුරුදහන් වීම්	පූර්ණ නිවාස හානි	අර්ධ නිවාස හානි	පීඩාවට පත් පුද්ගල සංඛ්‍යාව	පීඩාවට පත් පවුල් සංඛ්‍යාව
කණ්ඩි කඩා වැටීම්	170	9	8	0	5	531	4006	993
සුළි කුණාටු	4	0	0	0	7	197	793	218
දියේ ගිලීම්	57	57	5	8	0	0	77	9
ගොඩනැගිලි ගිනි ගැනීම්	62	1	7	0	106	53	729	175
ක්ෂණික ගංවතුර	22	0	0	0	1	20	7689	2009
ගංවතුර	134	3	8	3	20	1110	130382	32986
නායයෑම්	25	2	1	0	0	59	321	74
අකුණු ගැසීම්	112	11	16	0	0	215	1083	286
ගල් කඩා වැටීම්	24	0	0	0	1	34	145	37
දැඩි සුළං	855	8	34	1	34	10105	39895	11160
මුළු එකතුව	**1465**	**91**	**79**	**12**	**174**	**12324**	**185120**	**47947**

4.4.2 හදිසි මෙහෙයුම් සැලැස්ම යාවත්කාලීන කිරීම (NEOP) - (2017-2022)

2017 සිට 2022 දක්වා වසර 5ක කාලයක් සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලද ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP) 2022න් පසු නැවත එය යාවත්කාලීන කිරීම සහ ඒ සඳහා අදහස් හා යෝජනා ප්‍රතිචාර දැක්වීමේ සාකච්ඡාවක් පාර්ශවකරුවන් හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් අතර 2022.06.10 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි .

එම අදහස් යෝජනා ද ඇතුළත් කරමින් කෙටුම්පත් කරන ලද ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP) නැවත සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.




4.4.3 අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් යාත්‍රා (Boat) ස්ථානගත කිරීම

අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුධ හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ සම්බන්ධීකරණය වෙමින් 2022 මැයි 13 වන දින සිට රත්නපුර, කළුතර, ගාල්ල යන දිස්ත්‍රික්කවල බෝට්ටු සහ මුදවා ගැනීමේ කණ්ඩායම් ස්ථානගත කරන ලදී.

තවද, 2022 මැයි 24 දින සිට නිරිතදිග මෝසම් කාලය සක්‍රීය වීම හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුධ හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ එක්ව යාත්‍රා සහ මුදවා ගැනීමේ කණ්ඩායම් රත්නපුර, කලවාන, අයගම, මුවගම, ගාල්ල, තවලම, නෙළුව, නාගොඩ, මාපලගම සහ කළුතර යන ප්‍රදේශවලට දියත් කිරීමට සූදානම් කරන ලදී.

4.4.4 පූර්ව දැනුම්දීම්

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව දැනුම් දීමේ පද්ධතිය හරහා පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77ක්, 2009 වසරේ ස්ථාපිත කරන ලද අතර එය 2015 වසරේදී අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. තවද මෙම කුළුණු ක්‍රියා කරවීම සඳහා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් පුහුණු කොට හදිසි අවස්ථාවලදී ක්‍රියා කරවීමට සූදානම් කොට ඇත. එයට අමතරව කෙටි පණිවුඩ (SMS),Cell Broad cast ක්‍රමවේදය, HF/VHF ඇතුළු ක්‍රමවේද රැසක් ස්ථාපනය කොට බිම් මට්ටම දක්වා සම්බන්ධ කොට ඇත. ආපදා තොරතුරු ආපදාවන්ට පෙර, ආපදා අතරතුරදී සහ ආපදාවන්ට පසුව යන ක්‍රමවේදවලට අනුගතව පැය 24 x7 තුළ දැනුම් දෙනු ලබයි.
- පෘතුවියේ සිදු වන භූමි කම්පා පිළිබඳව නිරීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.

ඉන්දු ඕස්ට්‍රේලියානු භූ කාරක තැටියේ පමණක් නොව පෘතුවියට අයත් සියළුම භූ කාරක තැටි තුළ හටගන්නා භූමි කම්පා පිළිබඳ තොරතුරු **USGS** මඟින් ලබා ගෙන එම තොරතුරු මත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා භූ විද්‍යා පතල් හා කැණීම් කාර්යාංශය (**GSMB**) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම තොරතුරු අනුව භූමි කම්පා ඇති වූ විට ඒවා පිළිබඳ අදාළ දිස්ත්‍රික්කයන්හි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දැනුවත් කිරීම හා අවශ්‍ය මඟපෙන්වීම සිදු කර සුනාමි ඇති වීමට ඇති ඉඩකඩ පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සතු VHF/HF/UHF සන්නිවේදන ජාලයන් හරහා ජනතාවට පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය නිරන්තර යාවත්කාලීන කිරීම කරනු ලබන අතර ඒ හරහා බිම් මට්ටමින් ජනතාව ඉතා කෙටි කාලයකින් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තොරතුරු නිලධාරියා හරහා (Information Officer) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට තොරතුරු දැන ගැනීමේ පනතට ප්‍රකාරව ලැබෙන සියලු ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන ලදී.
- පූර්ව අනතුරු ඇගවීමේ කුළුණුවල නඩත්තු කටයුතු මනාව පවත්වාගෙන යාම, දෛනික පරීක්ෂා කිරීම් කටයුතු සහ අධීක්ෂණ කටයුතු නිසි ලෙස සිදු කරන ලදී. මෙය සන්නිවේදන අංශය සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි.
- DEWN පද්ධතියේ ග්‍රාහකයන් ප්‍රමාණය 35,000 දක්වා වැඩි කිරීමට කටයුතු කළ අතර නව DEWN පද්ධතිය හඳුන්වා දීම සහ නිලධාරීන් ඒ පිළිබඳ පුහුණු කිරීම සිදු කරන ලදී. සියලුම මාධ්‍ය හරහා පැය 24x7 තුළ පූර්ව අනතුරු ඇඟවීම් පතුරුවා හැරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරනු ලබන අතර SMS සහ අනෙකුත් ක්‍රමවේද හරහා ද බලපෑමකට ලක් විය හැකි ජනතාව වෙත ද අනතුරු ඇඟවීම් ලබා දී ඇත. තවද සියලුම ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් DEWN,SMS පද්ධතිය හා සම්බන්ධ කරන ලදී.
- හදිසි මෙහෙයුම් මැදිරිය පුළුල් කිරීමත් සමඟ සියලු ස්වයංක්‍රීය පද්ධතීන් (USGS, Ventusky , Windy, Automated Rain Gauges Systems-NBRO, MET & Irrigation, Online Reservoirs System, Online River Status System, PRISM, Local and International TV channels) යාවත්කාලීන කිරීම සහ සම්බන්ධ කිරීමේ කටයුතු සිදු කිරීම.
- **MOBILIZE** දත්ත පද්ධතිය හදිසි මෙහෙයුම් මැදිරිය තුළ ස්ථාපිත කොට හදිසි අවස්ථාන්හිදී සිතියම් ඇතුළු සජීවී පරිමාණයන් ගැනීමට කටයුතු සිදු කරන ලදී.
- කුඩා හා මධ්‍ය ව්‍යාපාරික ප්‍රජාවේ පණිවුඩ බෙදා හැරීමේ හැකියාව ඇති ප්‍රජාවන් **DEWN** දත්ත පද්ධතිය සමඟ ඒකාබද්ධ කොට යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර සිවිල් ආරක්ෂක බලකායේ දිස්ත්‍රික් මට්ටම් නිලධාරීන් **DEWN** දත්ත පද්ධතිය හරහා යා කොට යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.
- ආපදා අවදානම් ප්‍රදේශවල වෙසෙන ආපදාවට ලක් විට හැකි පුද්ගලයන් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදය හරහා කාර්යක්ෂමව හා කාලෝචිතව එම පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනය කෙටි පණිවුඩ මාර්ගයෙන් ඔවුන් වෙත ලබා දී ජීවිත හා දේපළ සුරක්ෂිතතාවය ඇතිකරලීම වෙනුවෙන් ආපදා

කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විදුලි සංදේශන කොමිෂන් සභාව, ඩයලොග් ආසියාටා (Dialog Axiata) පුද්ගලික සමාගම, මොබිටෙල් (Mobitel) පුද්ගලික සමාගම, හච් (Hutch) පුද්ගලික සමාගම සහ එයාටෙල් (Airtel) යන සේවා සපයන පුද්ගලික සමාගම් අතර අවබෝධතා ගිවිසුම 2022.07.20 අත්සන් කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සියලු ආපදා බලපෑම්වලට ලක්විය හැකි ජනතාව ඉතා කෙටි කාලයකින් දැනුවත් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක අතර එය විදුලි සංදේශ නියාමන කොමිසම් සභාව (**TRCSL**) මඟින් තාක්ෂණිකව අධීක්ෂණය සිදු කරනු ලබයි.

4.4.5 ඇමතුම් මැදිරිය

<u>117 ඇමතුම් මැදිරියේ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම</u>

මෙමඟින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීවරුන්, සහන සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ගේ දුරකතන අංක යාවත්කාලීන කිරීම සහ ගංවතුර සහ නායයෑම්වලින් බලපෑමට ලක් වන දිස්ත්‍රික්ක ආපදාවට අදාළව ප්‍රතිචාර දක්වන තාක්ෂණික ආයතනවල සියලු නිලධාරීන්ගේ දුරකතන අංක ක්ෂණිකව ලබා ගත හැකි ආකාරයට දත්ත ගබඩාවක් සකස් කරන ලදී. නව පරිගණක පද්ධති 5ක් සහ නවීන ජාල පද්ධතියක් 117 ඇමතුම් මැදිරිය තුළ ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. මේ හරහා ඉතා කාර්යක්ෂමව මෙම ඇමතුම් ක්‍රමවේදය පවත්වා ගැනීමට කටයුතු සලසා දෙන ලදී. 2022 වර්ෂය තුළ සමස්ත දුරකථන ඇමතුම් **253,734**ක් ද ඇමතුම් මැදිරිය වෙත ලැබී ඇත.

වගුව 4.4.2: ඇමතුම් වාර්තාව 2022.01.01 සිට 2022.12.31

ඇමතුම් වාර්තාව (2022.01.01 සිට 2022.12.31)				
අනු අංකය	**මාසය**	**ආපදා සම්බන්ධ දුරකතන ඇමතුම්**	**සාමාන්‍ය තොරතුරු**	**ලැබුණු මුළු ඇමතුම් ගණන**
1	ජනවාරි	7	21,396	21,403
2	පෙබරවාරි	14	20,530	20,545
3	මාර්තු	11	19,359	19,370
4	අප්‍රේල්	26	24,106	24,132
5	මැයි	25	25,366	25,391
6	ජූනි	14	22,277	22,291
7	ජූලි	14	21,462	21,476
8	අගෝස්තු	25	20,656	20,681
9	සැප්තැම්බර්	21	20,144	20,165
10	ඔක්තොම්බර්	93	19,297	19,390
11	නොවැම්බර්	38	18,745	18,783
12	දෙසැම්බර්	72	20,035	20,107
මුළු එකතුව		**360**	**253373**	**253,734**

4.4.6 පුහුණු වීම්

<u>අන්තර්ජාතික සෙවුම් සහ මුදවා ගැනීම් පාඨමාලා පැවැත්වීම (INSARAG)</u>

2022 වර්ෂයට අදාළව සෙවීම් සහ මුදවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු පාඨමාලා 3ක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) රු. 8,984,495.00ක මූල්‍ය දායකත්වයෙන් සහ අන්තර් ජාතික සෙවුම් සහ මුදවා ගැනීම් සාමූහිකත්වයේ (INSARAG Adversary group) තාක්ෂණික දායකත්වයෙන් පැවැත්වීමට සැලසුම් කරන ලදී. ඒ අනුව සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රමවේදය පිළිබඳ පළවන පුහුණු පාඨමාලා සඳහා පහත සඳහන් ආයතනවලින් පාඨමාලාලාභින් සහභාගී වන ලදි.

තව ද, අන්තර් ජාතික සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රමවේදයට අනුකූලව පුහුණු පාඨමාලාවන් 03ක් දින 10ක් බැගින් පහත සඳහන් ස්ථාන ආශ්‍රිතව පවත්න ලදී.

- කොළඹ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව (දින 01)
- කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්ය බලකා පුහුණු පාසල (දින 01)
- නාවික හමුදා ගගේවාඩිය ආපදා පුහුණු පාසල (දින 03)
- ගම්පොල යුධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු පාසල (දින 05)

ඊට අමතරව පුහුණුකරුවන් පුහුණු කිරීමේ පුහුණු උපදේශක සමාලෝචන එක් දින වැඩමුළුවක් (Training Instructor Review Workshop) 2022 ඔක්තොම්බර් මස 20 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් ඉහතින් සඳහන් කළ පුහුණු පාසල් වන පුහුණු උපදේශකයින් වෙනුවෙන් මෙම වැඩමුළුව පවත්වන ලදී. මෙහි ප්‍රධාන වශයෙන් අන්තර් ජාතික සෙවුම් සහ මුදවා ගැනීම් පාඨමාලාවේ (INSARAG) දියුණු කර ගත යුතු ක්ෂේත්‍රයන්, හඳුනාගත් දුර්වලතා සහ නව යෝජනා වැනි කරුණු පිළිබඳ එහිදී සාකච්ඡා කරන ලදී.

වගුව 4.4.3: පාඨමාලාවන් පැවැත්වූ කාලසීමාවන් සහ සහභාගී වූවන්ගේ සංයුතිය

පාඨමාලා කාලය	සහභාගී වූ සාමාජිකයන් ගණන								
	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	පොලිස්	ගිනි නිවීම් නිලධාරීන්	වෛද්‍ය නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය)	සුව සැරිය ගිලන් රථ සේවාව (1990)	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	එකතුව
ජුනි 20 සිට29	22	5	5	5	5	1	1	1	45
ජූලි 18 සිට 27	20	5	5	2	5	1	1	1	40
සැප්තැම්බර් 19 සිට 29	41	-	-	-	-	-	-	-	41
එකතුව	83	10	10	07	10	02	02	02	126




සැප්තැම්බර් 19 සිට 29 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානය -ගම්පොල හි පැවැත්වූ පුහුණුවෙහි අවස්ථා

<u>හදිසි ප්‍රතිචාර දැක්වීම වර්ධනය කිරීම සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන (PEER Programme)</u>

හදිසි ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන (PEER Programme) 2022 වසර තුළදී ද ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානයේ (ADPC) මූල්‍ය දායකත්වයෙන් පහත දක්වා ඇති පාඨමාලා වර්ගීකරණ 4 යටතේ පවත්වන්නට යෙදුණි.

අ.	ආපදා ප්‍රතිචාර සඳහා ප්‍රජා ක්‍රියාමාර්ග	- CADRE
ආ.	කඩා වැටුණු ගොඩනැගිලි ආශ්‍රිත සෙවීම් හා මුදවා ගැනීමේ කණ්ඩායම්	- CSSR
ඇ.	පළමු ප්‍රතිචාර දැක්වීමේ වෛද්‍ය කණ්ඩායම්	- MFR
ඈ.	හදිසි අවස්ථාවන් සඳහා රෝහල්වල පෙර සූදානම	- HOPE

මෙහිදී දින 12කින් සමන්විත පළමු පුහුණු වැඩසටහන වන ආපදා ප්‍රතිචාර සඳහා ප්‍රජා ක්‍රියාමාර්ග ගැනීම (Community Action for Disaster Response – CADRE) යටතේ,

අ. මූලික පාඨමාලාවක්

ආ. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්

ඇ. උපදේශකයින් පුහුණු කිරීමේ වැඩමුළුවක් ඇඹිලිපිටිය යුධ හමුදා ඉංජිනේරු පුහුණු පාසලෙහි පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා පාකිස්ථානයේ පංජාබ් ප්‍රාන්තයේ ලාහෝර් නගරයේ හදිසි සේවා පුහුණු විද්‍යා පීඨයේ (Emergency Service Academy Rescue 1122) අන්තර්ජාතික සුදුසුකම්වලින් සමන්විත උපදේශක උපදේශිකාවන් 9 දෙනෙකු විසින් මෙහෙයවනු ලැබීය.

ඉහත සඳහන් කළ වැඩසටහන්වලට අමතරව හදිසි ප්‍රතිචාර දැක්වීම වැඩිදියුණු කිරීමේ අරමුණින් පළමු ප්‍රතිචාර දැක්වීමේ වෛද්‍ය කණ්ඩායම් සහ කඩාවැඩුණු ගොඩනැගිලි ආශ්‍රිත සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන් 5ක් ඔක්තොම්බර් සහ නොවැම්බර් යන මාසවල ගම්පොළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයෙහි පවත්වන ලදී.

ඒ සඳහා යොවුන් සේනාංකය, සර්වෝදය සංවිධානය, රතු කුරුස සංවිධානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, Voluntary Organization for Vulnerable Community Development (VOVCOD) යන රාජ්‍ය නොවන සංන සහ ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC) ආයතනවලින් සාමාජිකයින් සහභාගී වන ලදී. මෙම පුහුණු වැඩසටහන හදිසි ආපදා තත්ත්වයකදී පුද්ගලයන් බේරා ගැනීම සිදු කරන ආකාරය, පුද්ගලයන්ට ප්‍රථමාධාර ලබාදීම, තුවාලකරුවන් සහ මළ සිරුරු

කළමනාකරණය, දියේ ගිලී අනතුරට පත් පුද්ගලයන් බේරා ගැනීම, ගිනි නිවීම් වැනි ක්‍රියාකාරකම් ඔස්සේ පවත්වන ලදී.

හදිසි ආපදා අවස්ථාවකදී ඒ ඒ ප්‍රදේශවල ජනතාව බේරා ගැනීම, ඔවුන්ට නිසි වෛද්‍ය ප්‍රතිකාර ලැබෙන තෙක් ජීවිතය රැක ගැනීම, විපතට පත් වූවන් ආරක්ෂාකාරී ලෙස ඉවත් කර ගැනීම, ආපදා ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් පැමිණෙන තුරු තත්ත්වය පාලනය කිරීම සහ ඔවුන්ට අධාර ලබාදීම යනාදි විෂයන් ප්‍රගුණ කිරීම මෙහි මූලික අරමුණ විය.

<u>වේගවත්ව ගලා යන ජලයේ සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණුව (Swift Water Search & Rescue Training)</u>

ආපදා කළමනාකරණය සඳහා ආසියා පැසිෆික් සංවිධානයේ (APAD) මූල්‍ය දායකත්වයෙන් 2022.09.26 දින සිට 2022.09.20 දින දක්වා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වේගවත්ව ගලා යන ජලයේ සිදු කරන සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණු පාඨමාලාව (Swift Water Search & Rescue Training) ජපානයේ ජාත්‍යන්තර විශේෂඥයින් විසින් ඇඹිලිපිටිය, තුංකම යුද්ධ හමුදා පුහුණු පාසලේදී පැවැත්විය.





වේගවත්ව ගලා යන ජලයේ සෙවීම් හා මුදවා ගැනීමේ පුහුණුව

<u>පාකිස්ථානයේ පිහිටි 6th National Community Emergency Response Team (CERT) Challenge තරඟය සඳහා සහභාගී වීම</u>

2022 අගෝස්තු මස 1 දින සිට 12 දක්වා ඇඹිලිපිටිය යුධ හමුදා ඉංජිනේරු පාසලයෙහි පැවති CADRE පුහුණු පාඨමාලාවේ ප්‍රථිපලයක් අනුව ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානයේ (ADPC) පූර්ණ අනුග්‍රහය මත Emergency Service Academy 1122 මඟින් 6th national Community Emergency Response Team (CERT) Challenge තරඟය 2022 දෙසැම්බර් මස 5 වන දින සිට 9 වන දින දක්වා පාකිස්ථානයේ පංජාබ් ප්‍රාන්තයේ ලාහෝර් නගරයේ මුදවා ගැනීම් පුහුණු කිරීම් මධ්‍යස්ථානයේ (Emergency Rescue Academy 1122) පවත්වන ලදී. මෙම තරඟය පාකිස්ථානු Emergency Rescue Academy 1122 පුහුණු උපදේශකයන් විසින් සිදු කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 7 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විවිධ ස්වේච්ඡා ආයතන එනම්, ජාතික යොවුන් බලකාය, සර්වෝදය, ජාතික ක්ෂම ආයතනය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් සහභාගී විය.

පාකිස්ථානයේ පැවති මෙම තරඟය සඳහා එරට විවිධ සංවිධාන නියෝජනය කරමින් කණ්ඩායම් 80ක් පමණ සහභාගී වූ අතර ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පංජාබ් ප්‍රාන්තයේ මහ ඇමතිතුමන් සහභාගී විය. මෙම තරඟය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අභ්‍යාස පරීක්ෂණයන් ඇතුළත් විය,

- හදිසි අනතුරක් සඳහා සූදානම් වීම.
- විශාල තුවාලකරුවන් ප්‍රමාණයක් පාලනය කිරීම.
- හදිසි තත්ත්වය පාලනය කිරීම.
- ප්‍රථමාධාර ලබාදීම.
- මළසිරුරු කළමනාකරණය
- මූලික මුදවා ගැනීම් සහ පරික්ෂා කිරීම් සිදු කිරීම.
- දියේ ගිලි අනතුරට පත් වී සිටින පුද්ගලයෙකු බේරා ගැනීම.
- විවිධ ගැට වර්ග පිළිබඳ දැනුම.
- කෘතිම ස්වසනය (CPR) ලබා දීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් විය.

මෙම තරගය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා, අධ්‍යක්ෂ (මෙහෙයුම්) සහ ගම්පොළ යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක සහ ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC) මෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී විය. සම්පූර්ණ සංචාරය සඳහා වූ පිරිවැය ආසියානු ආපදා සූදානම් මධ්‍යස්ථානය මඟින් (ADPC) දරනු ලැබීය.

තවද, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මේ සඳහා සහභාගී වූ කණ්ඩායම එහිදී දැක්වූ විශේෂ දක්ෂතා හා කුසලතා මත විශේෂ කුසලතා කුසලානය හිමි කර ගැනීමට සමත් වීම මෙහි ලද සුවිශේෂ ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය.





පාකිස්ථානයේ පංජාබ් ප්‍රාන්තයේ ලාහෝර් නගරයේ මුදවා ගැනීම් පුහුණු කිරීම් මධ්‍යස්ථානයේ (1122 Rescue Academy) ලබා ගත් ඡායාරූප කිහිපයක්

<u>හදිසි මෙහෙයුම් අංශය සඳහා Drone කණ්ඩායමක් ස්ථාපිත කිරීම</u>

1. ආපදා කළමනාකරණයක දී භූමියේ ඇති තොරතුරු නිවැරදිව වාර්තා කිරීම තුළින් අනාගතයේ ඇති විය හැකි ආපදා තත්ත්වයන් පුරෝකතනය කිරීම හා ආපදා අවස්ථාවලදි අවශ්‍ය ඉදිරි කටයුතු සැලසුම් කිරීම, ජීවිත හා දේපළ බේරාගැනීමට සහය වීම පිණිස ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

2. දැනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් අංශයේ සතුව පවතින ඩ්‍රෝන යානා දෙකක් මේ සඳහා යොදා ගන්නා අතර, මේ සම්බන්ධව මූලික පුහුණු වැඩසටහන 2022 මැයි මස 24 සහ 25 යන දෙදින තුළ පවත්වන ලදි. ඒ අනුව පළමු දින න්‍යායික පුහුණුව (Theory) හදිසි මෙහෙයුම් අංශයේ ශ්‍රවණාගාරයේදී ද, දෙවන දින ප්‍රායෝගික පුහුණුව (Practical) නාරාහේන්පිට ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් භූමි ප්‍රදේශයක පවත්වන ලදි.

3. මෙම පුහුණුවේ දේශකවරුන් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ (Survey Department) නිලධාරීන් සහභාගී වන ලදි. ඊට අමතරව මෙම පුහුණු වැඩසටහන සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් අංශයේ නිලධාරීන් දෙදෙනෙකු ද, තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් දෙදෙනෙකු ද , පුහුණු අංශයෙන් එක් නිලධාරියෙක් ද සහ ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් නිලධාරීන් පස්දෙනෙකු ද මේ සඳහා සහභාගී වන ලදි.

4. එසේම මෙම පුහුණු වැඩසටහනට අමතරව ඩ්‍රෝන (Drone) පුහුණුව ලබාගත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලුම නිලධාරීන් 2022 ජුනි 17 වන දින පුත්තලම දිස්ත්‍රික්කයේ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගනිමින් සහයෝගය ලබාදෙන ලදි.

5. එසේම ඩ්‍රෝන පුහුණු වැඩසටහනේ තවත් පියවරක් වශයෙන් ඩ්‍රෝන යානාවලින් ගන්නා ඡායාරූප එම අවස්ථාවේදීම ප්‍රධාන මෙහෙයුම් මැදිරියට ලබා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ හදිසි මෙහෙයුම් අංශය විසින් මිලදි ගත් අතර, එමඟින් ලංකාවේ ඕනෑම ස්ථානයක සිට ආපදා අවම කිරීම හා ආපදා කළමනාකරණය සඳහා ඉදිරි තීරණ ගැනීම පහසු කිරීමේ අරමුණින් ඡායාරූප හදිසි මෙහෙයුම් මැදිරිය වෙත ලබා ගත හැකි පද්ධතියක් ස්ථාපිත කරන ලදි.

6. මේ පිළිබඳව සාර්ථක ප්‍රායෝගික පෙරහුරු අභ්‍යාසයක් 2023 ජනවාරි මස 09, 11 සහ 13 යන දිනවලදි ඩ්‍රෝන යානා යොදාගනිමින් නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් භූමි ප්‍රදේශයක පවත්වන ලදි.





<u>යුධ හමුදා නිලධාරීන් සඳහා පැවැත්වූ යාත්‍රා හැසිරවීමේ පාඨමාලාව</u>

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය Asia Pacific Alliance For Disaster Management (A- PAD) ආපදා කළමනාකරණය සඳහා ආසියා පැසිෆික් සංවිධානයේ සහයෝගිතාවය ඇතිව කුඩා යාත්‍රා පැදවීම, ජීවිතාරක්ෂක පුහුණුව සහ යාත්‍රා පැදවීමේදි භාවිත කරන උපකරණ (OBM යන්ත්‍රය ඇතුළත්ව) පිළිබඳ

පුහුණුවක් සිදු කරන ලදි. මෙම පුහුණුව ඉංජිනේරු පුහුණු පාසල ඇඹිලිපිටියෙහි පවත්වන ලද අතර මේ සඳහා යුධ හමුදාවේ කණ්ඩායම් (1x25) 03ක් පහත සඳහන් දිනයන්හිදි පවත්වන ලදි.

මොඩියුලර් I - 10 -12 මාර්තු 2022

මොඩියුලර් II - 14 – 16 මාර්තු 2022

18 – 20 මාර්තු 2022

<u>ගිනි නිවාරණ පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම</u>

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිල්ලේ රාජකාරි කරන පුද්ගලයින් හට ගිනි නිවාරණ පුහුණු වැඩ සටහන් 2022 වර්ෂයේදි සංවිධානය කරන ලදි.

- එහි පළමු වැඩසටහන කාණ්ඩ 02ක් යටතේ 2022 ජනවාරි මස 31 වන දින සහ 2022 පෙබරවාරි 03 වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේ පැවැත්වූ අතර ගිනි නියාමන පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදි.
- එම වැඩසටහනේ තවත් පියවරක් ලෙස ගිනි නියාමකවරු පුහුණු කිරීමේ විශේෂ පුහුණු වැඩසටහනක් විශේෂ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ද සමඟින් 2022 සැප්තැම්බර් මස 12 වන දින පවත්වන ලදි.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි කරනු ලබන හමුදා පුද්ගලයින් හා ආරක්ෂක අංශය පුද්ගලයින් සඳහා විශේෂ ගිනි නිවාරණ පුහුණු වැඩසටහනක් හා ප්‍රායෝගික පුහුණුවක් 2022 ඔක්තෝම්බර් මස 10 වන දින පවත්වන ලදි.




4.4.7 ප්‍රසම්පාදන

<u>2022 හදිසි මෙහෙයුම් අංශය සඳහා වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන</u>

2022 වර්ෂයට අදාළව හදිසි මෙහෙයුම් අංශය සඳහා රුපියල් මිලියන 5.5 මූල්‍ය ප්‍රතිපාදන ලෙස අයවැය මඟින් වෙන් වී තිබූ නමුත් 2022 වර්ෂය සඳහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය 3.78ක් පමණි. එම මුදලින් අවදානමට ලක් විය හැකි ප්‍රදේශවලට යෙදවීමට අවශ්‍ය හදිසි ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගැනීමෙන් සෙවීම් හා මුදවා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ඔරු අඟුල් (Catamaran) 7ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිලදී ගන්නා ලදී.

<u>ලෝක ආහාර සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් (WFP) 2022 වසර සඳහා හදිසි මෙහෙයුම් අංශය විසින් මිලදී ගත් උපකරණ</u>

- ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP) මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් රු. 597,966.45ක මුදලක් වෙන් කරන ලදී.
- ජංගම මෙහෙයුම් රථය සඳහා රු. 947,800.00ක වටිනාකමින් යුත් ලැප්ටොප් 2ක් මිලදී ගැනීම.
- හදිසි මෙහෙයුම් අංශය රු. 254,725.00ක සඳහා U හැඩය සහිත සාකච්ඡා මේසයක් මිලදී ගැනීම.
- පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ අරමුණින් රු.169,400.00ක වටිනාකමින් යුතු ජංගම දුරකතනයක් සහ වෙබ් කැමරා 2ක් මිලදී ගැනීම.

4.5 තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය

ආපදා කළමනාකරණ යාන්ත්‍රනයේදී තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය යොදා ගැනීමට අදාළව කටයුතු කිරීමේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් ඒකක තුළ දෛනික අවශ්‍යතා මෙන්ම ආපදා තත්ත්වයකට මුහුණදීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අවශ්‍යතාවයන්ට අදාළ කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව සිදු කිරීම මෙන්ම ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතීන් නිසි පරිදි පවත්වාගෙන යමින් මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී සේවයක් සැපයීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය විසින් සිදු කරනු ලබයි.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ඒකකයන්හි තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් පවත්වාගෙන යාම - එනම් පරිගණක පද්ධතින්, පැය 24x7 පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන ජාලකරණ පද්ධතීන්, මෘදුකාංග හා දෘඩාංග, සන්නිවේදන ජාලයන් නිසි පරිදි පවත්වාගෙන යාම, නඩත්තු කටයුතු සිදු කිරීම, නව ක්‍රමවේද ඇති කිරීම වැනි කරුණු හැදින්විය හැක.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන විසින් සිදු කරනු ලබන ජාතික මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ සහ ප්‍රාදේශිය මට්ටමේ සියලු කටයුතුවලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ලෙස අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබාදීම හා 24x7 පුරා ක්‍රියාත්මක 117 ජාතික ඇමතුම් මැදිරියේ සහ හදිසි මෙහෙයුම් මැදිරියේ ස්ථාපිතව පවතින සියලුම තාක්ෂණික උපාංග නිරන්තර පරීක්ෂාවට ලක්කර ක්‍රියාකරී තත්ත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සහ දිස්ත්‍රික් ඒකකයන් හි සියලුම කාර්ය මණ්ඩල සඳහා VPN දුරකතන සම්බන්ධතා ලබාදෙමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම මෙන්ම දුරස්ථ සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන Zoom, Team වැනි තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් දුරස්ථ සන්නිවේදන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබා දීම.

ආපදා කළමණාකරණ යාන්ත්‍රණයේදී පූර්ව අනතුරු ඇඟවීම් සඳහා භාවිත කරන සන්නිවේදන පද්ධතීන් අලුත්වැඩියා කර නඩත්තු කටයුතු සිදුකිරීම සහ නව ක්‍රමවේද ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- සුනාමි පූර්ව අනතුරු ඇගවීමේ කුළුණු 77ට අදාළව සිදුකරනු ලබන කටයුතු

- වෙරළ බඩ තීරයේ පිහිටි සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77 හදිසි ආපදා තත්ත්වයකදී එම කුළුණු වෙත ගොස් Manual ක්‍රියාත්මක කිරීමේ කටයුතු වෙනුවෙන් ත්‍රිවිද හමුදාව හා පොලීසියේ අදාළ අංශයන් වෙත භාවිතය සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම ලබාදීම හා ඊට අදාළ ප්‍රායෝගික පුහුණුව ලබාදීම හා පවතින සීමිත ප්‍රතිපාදන මත හඳුනාගත් අලුත්වැඩියා කළ හැකි කුළුණු කිහිපයක් අලුත්වැඩියා කර ක්‍රියාකාරී මට්ටමට පත් කිරීම.
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා බලකායේ තාක්ෂණික දායකත්වය සහිතව මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි සියලුම පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ක්‍රියාකිරී මට්ටමට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.




Disaster Early Warning Network-(DEWN) ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ජාලය මෙමඟින් ආපදා පිළිබඳ කෙටි පණිවිඩ (SMS) සහ Mobile APP භාවිතයෙන් මහජනතාව වෙත ඉතා කෙටි කාලයක් තුළ ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු ලබාදිය හැකි අතර මේ සම්බන්ධයෙන් සම්පත් දායකත්වය ලබාදෙනු ලබන මොරටුව විශ්ව විද්‍යාලය සහ ඩයලොග් ආයතනය සම්බන්ධීකරණය මඟින් පද්ධතිය යාවත්කාලීන කර ඒ සම්බන්ධයෙන් හදිසි මෙහෙයුම් මැදිරියේ රාජකාරී භාර නිලධාරීන් වෙත පුහුණුවක් ලබාදීම.


- Early Warning Cell ලෙස සියලුම ජංගම දුරකථන සේවා සපයන්නන් සන්නිවේදන ජාල ජාලකරණ පද්ධතිය
    - ශ්‍රී ලංකාව තුළ ජංගම දුරකථන සේවා සපයන්නන් සියලු දෙනා සමඟ ඕනෑම ආපදාවකදී ඔවුන් සතු ජාලයන් උපයෝගී කර ගනිමින් සියලු පාරිභෝගිකයින් හට පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු ලබාදිය හැකි නව ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට අදාළ තාක්ෂණික දායකත්වය ලබාදීම.
- UHF/VHF සන්නිවේදන ජාලය


මේ වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව පවතින ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීමට අවශ්‍යව පවතින අතර ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගුවන් විදුලි සම්ප්‍රේශණ ක්‍රමවේදයේ තාක්ෂණය යොදා ගනිමින් ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ ගුවන් විදුලි සන්නිවේදනයට අවශ්‍ය වන සම්ප්‍රේශණ සම්බන්ධතාවයන් එනම්


කොළඹ/පිදුරුතලාගල/ලග්ගල/මඩුකන්ද ගොන්ගන සහ කොකාවිල් ආවරණය වන පරිදි සම්ප්‍රේෂණය ස්ථාපත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම.

- ප්‍රාදේශීය ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සන්නිවේදන අංශය විසින් ඌව පළාතේ බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනයන්හි ආපදා අවදානම් සිතියම් සකස් කිරීම සඳහා සම්පත් දායකත්වය ලබාදෙන ලදී. එමෙන්ම අධ්‍යන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගයන් පැවැත්වෙන කාලය අතුරතුරදී ආපදා අවදානම පිළිබඳව තක්සේරු කිරීම සඳහා ඓතිහාසික දත්ත මත පදනම්ව භූ තොරතුරු තාක්ෂණික සිතියම් නිර්මාණය කිරීම සන්නිවේදන අංශය විසින් සිදු කරන ලදී.










- වෙරළබඩ තීරයේ සුනාමි අධි අවදානම් පාසල් අශ්‍රිතව සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපනය කිරීම.
  - මෙහි මූලික අදියර යටතේ දකුණු පළාතේ හඳුනාගත් පාසල් 04ක් සඳහා මෙම පද්ධතීන් ස්ථාපිත කිරීමට පවතින අතර එහි පළමු පද්ධතිය 2022/12/26 දින ජාතික සුරක්ෂා දිනයට සමගාමීව ගාල්ල අම්බලන්ගොඩ මාදම්පාගම මධ්‍ය මහා විද්‍යාලයේ දී ජනතා අයිතියට පත්කිරීමට කටයුතු කරන ලදි. මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකායේ තාක්ෂණික දායකත්වය සහිතව ස්ථාපනය කළ අතර ශ්‍රී ලංකා ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදන පද්ධතියට එක් වූ තවත් එක් තාක්ෂණික පද්ධතියක් ලෙස හැඳින්විය හැක.







<u>අභියෝග</u>

- හදිසි ප්‍රතිචාර දැක්වීමේදී සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් සඳහා අවශ්‍ය හදිසි මූල්‍යමය ප්‍රතිපාදනයන් වෙනුවෙන් හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා වූ හදිසි අරමුදලක (Emergency Fund) අවශ්‍යතාවය.
- ආපදා කළමනාකරණය සිදු කිරීමට අත්‍යවශ්‍ය අංගයක් ලෙස පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය ඉතා වැදගත් වේ. එම සම්බන්ධීකරණය සිදු කිරීමට අවශ්‍ය සන්නිවේදන ජාලය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගත යුතුය. එම උපකරණ ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා ශක්තිමත් කළ යුතුය. එලෙසටම බිම් මට්ටමේ ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය උපකරණ, සැලසුම් සහ අනෙකුත් වැඩසටහන් මඟින් බිම් මට්ටම ශක්තිමත් කිරීමත් එක් එක් මට්ටම්වලට (ජාතික, දිස්ත්‍රික් බිම් මට්ටමට) අදාළව පූර්ව අනතුරු ලබා දීම සඳහා අවශ්‍ය උපකරණ ද ශක්තිමත් කිරීම.
- 2009 වසරේදී ස්ථාපිත කරන ලද පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු මේ වන විට වන්ද්‍රිකා තාක්ෂණය භාවිත කර ගනිමින් ක්‍රියාත්මක නොවන අතර VHF සන්නිවේදන ජාලය මඟින් ද කිහිපයක් පමණක් ක්‍රියාත්මක වේ. එබැවින් මෙම පද්ධතිය නැවත සක්‍රීය තත්ත්වයට ගෙන ඒම හෝ අලුතින් බහුවිධ ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු සිදු විය යුතු වීම.
- හදිසි මෙහෙයුම් මැදිරිය හා 117 ඇමතුම් මැදිරිය පැය 24X7 රාජකාරී කරන බැවින් ඒ සඳහා විවිධ භාෂා මඟින් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) සන්නිවේදනය කරනු ලබයි. එහෙත් මේ වන විට දමිළ බස හැසිරවීම සඳහා කාර්යය මණ්ඩලයක අවශ්‍යතාවය පවතී.
- පළාත් පාලන අංශයන් ආපදා කළමනාකරණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ ඒකක සමඟ සක්‍රීයව ආපදා අවස්ථාවලදී සම්බන්ධ කර ගැනීම සඳහා කටයුතු සිදු කළ යුතු වේ.
- හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ඇති සම්පත් ප්‍රතිඵලදායී ලෙස හදිසි ප්‍රතිචාර සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නිසි ප්‍රතිපාදන නොමැති වීම.
- 117 ඇමතුම් මැදිරිය තාක්ෂණිකව සහ බහු ක්‍රමවේද සහිතව වැඩිදියුණුකර ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රතිපාදනවල අවශ්‍යතාවයක් පවතී.
- ත්‍රිවිධ හමුදා මුදා ගැනීමේ කණ්ඩායම් සඳහා අවශ්‍ය කරන මූලික උපකරණ ලබාදීම.

4.6 මූල්‍ය අංශය

4.6.1 මූල්‍ය ප්‍රගතිය (2022 දෙසැම්බර් මස 31 වන දිනට)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා, 2022 වසර වෙනුවෙන්, රු.මි. 439ක සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණයක්, වාර්ෂික අයවැය මඟින් වෙන්කර ඇති අතර, එම සමස්ත ප්‍රතිපාදනවලින්, රු.මි.318ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන්ව තිබූ අතර, ඉන් රු.මි. 281.05ක්, ආයතනයේ අත්‍යවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වැය කරන ලදි. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්වූ රු.මි.121ක ප්‍රතිපාදනවලින්, රු.මි.95.04ක් ද පහත සඳහන් පරිදි වැය කර තිබේ.

වගුව **4.6.1:** මූල්‍ය ප්‍රගතිය (2022 දෙසැම්බර් මස 31 දිනට)

වැය විෂය අංකය	වැය විෂය/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)	මූල්‍ය ප්‍රගති %	භෞතික ප්‍රගති %
442-2-6-1-1503	පුද්ගල පඩිනඩි	233	204.85	88	88
442-2-6-1-1509	වෙනත් මෙහෙයුම් වියදම්	85	76.20	90	90
	මුළු පුනරාවර්තන වියදම	**318**	**281.05**	**88**	**88**
	ප්‍රාග්ධන වියදම්				
442-2-6-1-2201 (i)	සේවක පුහුණු, හැකියා හා ධාරිතා වර්ධනය	1.0	0.54	54	54
442-2-6-1-2201 (ii)	ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපනය සහ පුනරුත්ථාපනය	8.0	2.7	34	34
442-2-6-2-2509	දිස්ත්‍රික්කවල ආපදාවන්හි බලපෑම් අවමකිරීමට ආපදා වැළැක්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	75	70.42	94	98
442-2-6-3-2509 (i)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - දැනුවත්කිරීම් අංශය	7.5	7.3	97	97
442-2-6-3-2509 (ii)	ආපදා පෙරසුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත්කිරීම් - පෙරසූදානම අංශය	7.5	4.81	64	64
442-2-6-4-2509	ශ්‍රී ලංකාව සඳහා බහු උපද්‍රව අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම	1	0.64	64	64
442-2-6-5-2103	නායයෑම්, ගංවතුර හා නියඟ අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය	6	4.11	69	90
442-2-6-7-2509(13)	පළාත් පාලන ආයතන සඳහා ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැළසුම් සැකසීම	15	4.63	31	31
	ප්‍රාග්ධන වියදම්වල එකතුව	**121**	**95.15**	**79**	**82**

Annex 01

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF FINANCIAL POSITION AS AT 31ST DECEMBER 2022

	Notes	2022 Rs. '000	2021 Rs. '000
Assets			
Current Assets			
Cash & Cash Equivalents	3	3,197	10
Deposits & Other Receivables	4	1,658	3,130
Prepayment & Advances	5	460	1,731
Inventories	6	8,228	5,466
Disaster Response Equipment in Stock	7	17,392	46,701
Intangible Assets Work - in progress		2,205	174
		33,140	57,212
Non-Current Assets			
Intangible Assets	8	10,481	12,291
Property, Plant & Equipment	9	519,575	594,173
Total Non - Current Assets		530,056	606,464
Total Assets		563,196	663,676
Liabilities			
Current Liabilities			
Other Provisions	10	206	206
Trade and Other Payable	11	14,779	18,938
		14,985	19,144
Non-Current Liabilities			
Retirement Benefits Obligations	12	16,611	24,338
Total Non - Current Liabilities		16,611	24,338
Total Liabilities		31,596	43,482
Net Assets		531,600	620,194
Equity/Funds & Reserves			
Equity & Reserves			
Accumulated Fund		78,291	123,036
Capital Grant of Assets – ICET Project		242,279	281,900
Revaluation Reserve – Motor Vehicles		206,436	206,436
Total Equity & Reserves		527,006	611,372
Grant from Other Organizations	13	4,594	8,822
Total Equity/Funds & Reserves		531,600	620,194

The Accounting Policies and Notes 1 to 18 attached form an integral part of these Financial Statements.

The Interim Management Committee is responsible for the Preparation and Presentation of these Financial Statements.

These Financial Statements were approved by the Interim Management Committee and signed for and on their behalf,

Nishantha Abeysinghe Director - Finance	Major General Sudantha Ranasinghe (Retd) Director General	H.U.R. Fonseka Chief Accountant Interim Management Committee - Member	General Kamal Gunaratne (Retd) Interim Management Committee - Chairman/Secretary of the Ministry

Major General S. Ranasinghe (Rtd.)
RWP RSP MSc ndu psc
Director General - Disaster Management Centre

H. U.R. Fonseka
Chief Accountant
Ministry of Defence
Disaster Management Division
Vidya Mawatha, Colombo 07.

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF FINANCIAL PERFORMANCE FOR THE YEAR ENDED 31ST DECEMBER 2022

	NOTE	2022 Rs. '000	2021 Rs. '000
Treasury Grant for Recurrent Expenditure	15	279,950	241,905
Other Income	16	73,823	149,789
Total Income		**353,773**	**391,694**
Administrative Expenses	17	(376,552)	(426,103)
Other Expenses	18	(21,799)	(11,315)
Surplus/(Deficit) From Operations		**(44,578)**	**(45,724)**
Treasury Grant for Capital Expenditure	18.1	102,898	242,955
Capital Expenditure of the year	14	(112,792)	(196,420)
Surplus/(Deficit) After Capital Expenditure		**(54,472)**	**811**
Other Comprehensive Income			
Items that will not be reclassified subsequently to profit or loss			
Actuarial gain/(loss) on defined benefit obligation	12.1	9,727	7,184
Total Comprehensive Income		**(44,745)**	**7,995**

The Accounting Policies and Notes 1 to 18 attached form an integral part of the Financial Statements.

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF CHANGES IN NET ASSETS / EQUITY

	Capital Grant Imprest	Assets Grant ICET – Project	Revaluation of Motor Vehicle	Accumulated Fund Surplus / (Deficit)	Total Amount of Net Assets
	Rs. '000	**Rs. '000**	**Rs. '000**	**Rs. '000**	**Rs. '000**
Balance as at 1st January 2021	**377,253**	**400,187**	**206,436**	**(262,575)**	**721,300**
Prior year adjustments	-	-	-	364	364
Amortization of the year	-	(118,287)	-	-	(118,287)
Capital Grant Received During the year	242,955	-	-	-	242,955
Investment on Capital Grant receipts of the year	(196,420)	-	-	-	(196,420)
Surplus / (Deficit) from operations of the year	-	-	-	(45,724)	(45,724)
Acturial gain on defined benefit obligation				7,184	7,184
Balance as at 31st December 2021	**423,788**	**281,900**	**206,436**	**(300,751)**	**611,372**
Balance as at 1st January 2022	**-**	**281,900**	**206,436**	**123,036**	**611,372**
Prior year adjustments				-	-
Amortization of the year	-	(39,621)	-	-	(39,621)
Capital Grant Received during the year	-	-	-	102,898	102,898
Investment on capital Grant Receipts of the year	-	-	-	(112,792)	(112,792)
Surplus / (Deficit) from operation of the year	-	-	-	(44,578)	(44,578)
Actuarial gain on defined benefit obligation	-	-	-	9,727	9,727
Balance as at 31st December 2022	**-**	**242,279**	**206,436**	**78,291**	**527,006**

The Accounting policies and Notes 1 to 18 attached form an integral part of the Financial Statements.

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF CASH FLOWS FOR THE YEAR ENDED 31ST

	2022 Rs. '000		2021 Rs. '000
Surplus / (Deficit) Before Taxation	**(44,578)**		**(45,724)**
Adjustments			
Depreciation and Amortization	85,833		167,027
Amortization of Capital Grant of Assets	(39,621)		(118,287)
Payment of Gratuity	(2,428)		(1,997)
Non – Cash Grant Received treated as other income	-		-
Retirement Benefit Obligations	4,428		(14,450)
Profit on Disposal of Assets	(53)		(135)
Operating Surplus / (Deficit) before working capital changes	**3,581**		**(13,566)**
Changes in working Capital			
(Increase)/ Decrease in of Assets work in progress	(2,031)		-
(Increase)/ Decrease in Deposits & other Receivables	1,472		6,372
(Increase)/ Decrease in Inventories	(2,762)		1,002
(Increase)/ Decrease in Disaster Response Equipment in Stock	29,309		(28,029)
(Increase)/ Decrease in Prepayment and Advances	1,271		336
(Increase)/ Decrease in Trade and other payables	(4,159)		8,705
Net Cash Flows from Operating Activities	**26,681**		**(25,180)**
Cash Flows from Investing Activities			
Acquisition of Property, Plant & Equipment (PPE)	(1,218)		(14,226)
Assets Grants	(8,354)		(10,468)
Sale proceeds on PPE Disposal	200		151
Net Cash Flows from Investing Activities	**(9,372)**		**(25,543)**
Cash Flows from Financing Activities			
Net Increase in Capital Grant (Receipt)	102,898		242,955
Net Increase in Capital Grant (Payments)	(112,792)		(196,420)
Net Grants from NGO / INGO	(4,228)		(7,422)
Prior year – cash receipts	-		363
Assets Grant from Financing	-		-
Net Cash Flows from Financing Activities	**(14,122)**		**39,476**
Net Changes in Cash & Cash Equipments	3,187		(10,247)
Cash & Cash Equivalents at the Beginning of the year	10		10,257
Cash & Cash Equivalents at the End of the year	**3,197**		**10**
NOTE A – CASH & CASH EQUIVALENTS	**Rs. '000**		**Rs. '000**
Cash at Bank	3,197		10
Cash in Hand			
Total	**3,197**		**10**

The Accounting Policies and Notes 1 to 18 form an integral part of the Financial Statements.

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF BUDGET & ACTUAL EXPENDITURE COMPARISON 2022

Capital Expenditure			**Rs. Mn**
Description	**Estimate - 2022 (Revised)**	**Actual Expenditure**	**Surplus/ (Variances)**
Disaster Management Centre - Capacity Building of Staff	1.0	0.52	0.48
Disaster Management Centre – Acquisition of Assets	8.0	2.7	5.30
Implementation Mitigation Projects to minimize the impacts of disasters in districts	75	70.42	4.58
Strengthening the capacity of the flood and landslides Disaster Response Mechanism	6	4.11	1.89
Awareness of Community on Disaster Management	7.5	7.3	0.20
Preparedness of Community on Disaster Management	7.5	4.81	2.69
Development of Multi Hazard Risk Profile for Sri Lanka	1	0.64	0.36
Preparation of Local Disaster Risk Reduction (DRR) Plans for Local Authorities	15	4.63	10.37
Total	**121**	**95.13**	**25.87**

Recurrent Expenditure			
Description	**Estimate - 2022 (Revised)**	**Actual Expenditure**	**Surplus/ (Variances)**
Personal Emoluments	233,000	204,272	28,728
Travelling Expenses	8,245	7,061	1,184
Supplies	22,628	21,002	1,626
Maintenance Expenditure	14,727	12,095	2,632
Contractual Services	39,400	32,464	6,936
Others	-	-	-
Total	**318,000**	**276,894**	**41,106**

The Accounting Policies and Notes 1 to 18 attached form an integral part of these Financial Statements.

DISASTER MANAGEMENT CENTRE

STATEMENT OF BUDGET & ACTUAL EXPENDITURE COMPARISON 2022

Recurrent Expenditure			**Rs.000'**
Description	**Estimate - 2022 (Revised)**	**Actual Expenditure**	**Surplus/ (Variances)**
Personal Emoluments			
Salaries & Wages	168,000	147,476	20,524
Overtime	15,000	8,807	6,193
Other Allowances	50,000	47,989	2,011
	233,000	**204,272**	**28,728**
Travelling and Subsistence			
Domestic Travelling	6,500	5,320	1,180
Foreign Travelling	1,745	1,741	4
	8,245	**7,061**	**1,184**
Supplies			
Stationary & Consumables	8,000	5,194	2,806
Fuel & Lubricants **	14,628	15,808	(1,180)
	22,628	**21,002**	**1,626**
Maintenance			
Maintenance of motor vehicle	6,127	5,886	241
Maintenance of plant, machinery, office equipment, furniture and others	8,600	6,209	2,391
	14,727	**12,095**	**2,632**
Services			
Transport	100	75	25
Electricity and Water	13,000	9,314	3,686
Post and Telecommunication	17,000	16,304	696
Rent and taxes	1,500	1,153	347
Other (Security, Janitorial services etc.)	7,800	5,618	2,182
Total	**39,400**	**32,464**	**6,936**

** Adverse variances are due to the Accrued Recurrent Expenditure.

The Accounting Policies and Notes 1 to 18 attached form an integral part of these Financial Statements.

DISASTER MANAGEMENT CENTRE
SIGNIFICANT ACCOUNTING POLICIES

1. GENERAL INFORMATION

1.1 LEGAL AND DOMICILE FORM

The Disaster Management Centre (the Centre) is a statutory body incorporated by Sri Lanka Disaster Management Act No.13 of 2005 (The Act), and domiciled in Sri Lanka, situated at Vidya Mawatha, Colombo 7.

The act provides for the establishment of the National Council for Disaster Management, which shall be establish Disaster Management Centre (DMC) for assisting the National Council for Disaster Management in implementing disaster risk management activities of Sri Lanka. An Interim Management Committee (IMC) has established to make decision for smooth functioning of the Centre with the leadership of the secretary to the ministry. At the present, The Disaster Management Centre is operating under the Ministry of Defence - Disaster Management Division.

1.2 PRINCIPAL ACTIVITIES AND NATURE OF OPERATIONS

The functions of the Centre established under subsection (1) of the Act shall be as assigned by the council, and shall include the following:

- Assisting the council in the preparation of the National Disaster Management Plan and the National Emergency Operation Plan and proposals for upgrading the same when it becomes necessary.
- Taking responsibility for the implementation of the National Disaster Management Plan and the National Emergency Operation Plan, and upon the Declaration of a state of disaster to direct and coordinate the implementation of the National Emergency Operation Plan.
- Ensuring that the various Disaster Management Plans prepared by Ministries, Government Departments or public corporations conforms to the National Disaster Management Plan.
- Based on Disaster Management Plans prepared by various ministries, Government Departments and Public Corporations under section 10 of the Act, preparing and implementing programs and plans for disaster preparedness, mitigation, prevention, relief, rehabilitation and reconstruction activities and coordinating of organizations which implement such programs and plans and obtain financial assistance from the

Treasury for such activities and release the same to the relevant regions and monitor and evaluate these activities.

- Issuing instructions and guidelines to appropriate organizations, non-government organizations, district secretaries and divisional secretaries on activities relating to disaster management and initiating and implementing work programs in co-ordination with such organizations and secretaries.
- Promoting research and development programs in relation to disaster management and setting- up and maintaining a database on disaster management.

SIGNIFICANT ACCOUNTING POLICIES

1.3 PRINCIPAL PLACE OF OPERATION

Head office of the Disaster Management Centre (DMC) has located at Vidya Mawatha Colombo 7. Further 25 no's of district coordinating units have been established in each District Secretariat.

1.4. GOING CONCERN

Financial Statements have been prepared on the assumption that the Centre is a going concern. The Management have assessed the Centre's ability to continue as a going concern as having in the foreseeable future. Furthermore, the management is not aware of any material uncertainties that may cast significant doubt upon the Centre's ability to continue as a going concern and they do not intend either to liquidate or to cease operations of the Centre. Therefore, the financial statements continue to be operated on the going concern basis.

1.5. FINANCIAL PERIOD

The Financial period of the Centre represents a twelve-month period 1st January 2022 to 31st December 2022.

1.6 BASIS OF PREPARATION OF FINANCIAL STATEMENTS

1.6.1 STATEMENT OF COMPLIANCE

The financial statements of the Centre have been prepared in accordance with Sri Lanka Public Sector Accounting Standards (SLPSAS) and other Accounting Standards issued by the Institute of Chartered Accountants of Sri Lanka.

These financial statements comprise the statements of financial position, statement comprehensive income, statement of changes in funds and reserves, statement of cash flows and notes to the financial statement. The Principal accounting policies applied in the

preparation of the financial statement are set out below. These policies have been consistently applied to all periods presented in the final statement unless otherwise stated.

1.6.2 BASIS OF MEASUREMENT

The financial statements have been prepared on accrual basis and under the historical cost basis, except where appropriate disclosures are made with regard to fair value under relevant notes.

SIGNIFICANT ACCOUNTING POLICIES

1.6.3 COMPARATIVE INFORMATION

Comparative information includes quantitative, narrative and descriptive information is disclosed in respect of the previous period for all amounts reported in the financial statement in order to enhance the understanding of the financial statements of the current period and to improve comparability.

1.6.4 MATERIALITY & AGGREGATION

Each material class of similar items is presented separately in the financial statements. Items of a dissimilar nature or function are presented separately, unless they are immaterial.

1.6.5 RESPONSIBILITY AND APPROVAL OF FINANCIAL STATEMENT

The Interim Management Committee, of the DMC acknowledges their responsibility for the financial statements were approved and authorized for issue by the Committee at the meeting held on 21st of February 2023.

1.6.6 FUNCTIONAL AND PRESENTATION CURRENCY

The financial statements are presented in Sri Lanka Rupees, which is the Centre’s functional and presentation currency, in the primary economics environment in which the Centre operates. All financial information presented in Sri Lankan rupees has been rounded to the nearest thousand unless stated otherwise.

1.7 SIGNIFICANT ACCOUNTING ESTIMATES AND JUDGMENTS

The preparation and presentation of financial statements, in conformity with Sri Lanka Public Sector Accounting Standards required management to make judgments, estimates and assumptions that affect the application of accounting policies and reported amounts of assets, liabilities, income and expenses. Actual results may differ from these estimates and judgments used.

(a) DEFINED BENEFITS PLANS

The cost of the retirement benefit plan of employees is determined using projected unit credit (PUC) method. Such method involves use of assumptions concerning the rate of interest, rate of salary increase and retirement age. Due to the long – term nature of the plan, such estimates are subject to significant uncertainty.

(b) CHANGES IN ACCOUNTING ESTIMATES AND JUDGMENTS

Any changes in accounting estimates and critical judgments are disclosed in the relevant notes to the financial statements.

2. SUMMARY OF SIGNIFICANT ACCOUNTING POLICIES

2.1 ASSETS AND THE BASES OF THEIR VALUATION

2.1.1 PROPERTY, PLANT AND EQUIPMENT

1. BASIS OF RECOGNITION AND MEASUREMENTS

Property, plant and equipment are recognized if it is probable that future economic benefits associated with the asset will flow to the Centre and the cost of the asset can be measured reliably.

All property, plant and equipment are stated initially at cost and subsequently measured at cost less accumulated depreciation and any impairment losses. Repair and maintenance cost are recognized in the statement of comprehensive income as incurred. The carrying value of property, plant and equipment are reviewed for impairment when events or changes in circumstances indicate that carrying value may not be recoverable.

2. DEPRECIATION

Depreciation is calculated by using a straight-line method on the cost of all property, plant and equipment, in order to write off such amounts over the estimated useful life of such assets. The estimated useful lives of assets are as follows:

Asset Category	**Useful life (years)**
Tri-forces Accommodation Building	20
Furniture	10
Tsunami and early warning tower	20
Telecommunication equipment	5 -20
Motor Vehicles	5-10
Computers	10
Office Equipment’s	10

Depreciation of an asset begins when it is available for use and cease at the earlier of the date that the asset is classified as held for sale and the date that the asset is derecognized. Significant items of property, plant and equipment with different useful lives are separately identified and depreciated.

SIGNIFICANT ACCOUNTING POLICIES

3. DERECOGNITION

An item of property, plant and equipment is derecognized upon disposal or when no future economic benefits are expected from its use or disposal. Any gain or loss arising on de recognition of the asset is calculated as the difference between the net disposal proceeds and the carrying amount and included in the statement of comprehensive income in the year, the asset is derecognized.

4. FULLY DEPRECIATED AND DISPOSED ASSETS

It has been identified and disposed the following items those who have been fully depreciated and derecognized within last 3 years.

	Disposed Value (Rs.Mn)			
Assets Category	**2019**	**2021**	**2022**	**Total**
Computer & accessories	12	2.5	2.1	16.6
Office Equipment	1.2	0.4	1.5	3.1
Furniture & Fittings	0.1	0.1	0.2	0.4
Telecommunication Equipment's- V Sat *	-	-	287.7	287.7
Total	**13.3**	**3.0**	**291.5**	**307.8**

* Sri Lankan air force has been checked and made a request to transfer the V-sat Communication system that was included in the Telecommunication equipment. Further, it has been transferred/disposed during the year with the approval of the Interim Management Committee Meeting held on 21st of February 2023.

5. FULLY DEPRECIATED ASSETS

Following technical items also has been fully depreciated up to now, but it has not still disposed. Since these items are highly technical, technically qualified professional team will be appointed to get the recommendation for the disposal and de-recognition of them.

Item Description	Value (Rs.Mn)
Solar Power System 25 DDMCU	18.8
Call Centre Software	40
Total	**58.8**

SIGNIFICANT ACCOUNTING POLICIES

2.1.2 INTANGIBLE ASSETS

Intangible assets are recognized if it is probable that future economic benefits attributable to the assets will flow to the entity and the loss of the assets can be reliably measured. Intangible assets that are acquired by the Centre are measured cost less accumulated amortization and accumulated impairment loss.

Amortization of an intangible asset begins when it is available for use and cease at the earlier of the date that the asset is classified at the date that the asset is derecognized. Significant items of intangible assets include Surveyor General GIS Data and Software with equal useful lives of 10 years each, separately identified and amortized

2.1.3 INVENTORIES

Inventories are stated at the lower of cost and net realizable value after making due allowances for obsolete and slow-moving items. Net realizable value is the estimated selling price in the ordinary course of business less the estimated cost of completion and selling expenses. The cost of inventories is based on Purchase price. The cost includes expenditure incurred in acquiring the inventories and bringing them to their existing location and condition. The inventories of the institute include Awareness books, leaflets, stationary & Consumables.

2.1.4 DEPOSITS AND RECEIVABLE

Deposits and receivables are recognized on the date that they are originated. Deposits and receivables comprise employee advances, deposits and other receivables.

2.1.5 CASH AND CASH EQUIVALENTS

